LOLC ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ් (LOLC සමූහයේ සමාගමකි)
සමාගම් ලි.ප.අංකය: PB 4823
ලියාපදිංචි කාර්යාලය: 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
ව්‍යාපාරියක කාර්යාලය: අංක 440, හැව්ලොක් පාර, කොළඹ 06, ශ්‍රී ලංකාව
දුරකථන: (011) 55 00 880 ෆැක්ස්: (011) 25 59 407 ඊ-මේල්: enquiry@lolcgeneral.com වෙබ්අඩවිය: www.lolcgeneral.com

වැදගත් :

**මෙය ඔබේ ඔප්පුවේ සිංහල පරිවර්තනයක් වන අතර එය කියවා තේරුම් ගැනීම සඳහා පමණි. මෙහි අඩංගු කරුණු පිලිබඳ යම් අවිනිශ්චිතතාවයක් මතුවූ විටක හෝ යම්කිසි නීතිමය කටයුත්තකදී බලපැවත්වෙනුයේ මෙම ඔප්පුවේ ඉංග්‍රීසි පිටපත බව කරුණාවෙන් සලකන්න.**

# ඔබේ රක්ෂණය

**මෙම අත්පොත ඔබේ ඔප්පු ලේඛනය වන අතර, ඔබේ රක්ෂණාවරණය පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඇතුළත් වෙයි.**

**ඔබේ රක්ෂණ ඔප්පුව සැකසී ඇත්තේ,**

- **මෝටර් රක්ෂණ යෝජනා පත්‍රය**
- **මෙම අත්පොත**
- **මෝටර් රක්ෂණාවරණ සහතිකය**
- **ඔප්පු ලේඛනය**

**යන කොටස් මගිනි.**

මෙම ඔප්පුව ඔබේ සුරක්ෂිතතාවය උදෙසා ඔබ සහ LOLC ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ් අතර, ගිවිසුමට සාක්ෂියකි. එය පරික්ෂාකාරීව කියවන්න. මෙම ඔප්පුව යටතේ සලසා ඇති ආවරණය මගින් ඔබේ අපේක්ෂාවන්ට/විශේෂිත අවශ්‍යතාවන්ට අනුකූල නොවන යම් දෝෂයක් හමුවුවහොත්, එය නිවැරදි/සංශෝධනය කිරීම සඳහා සමාගම වෙත වහා නැවත එවිය යුතුය.

# වැදගත් සටහන්

**1. අභිමිවීම හෝ හානි වැළැක්වීම උදෙසා ඔබේ වගකීම**

ඔබේ වාහනය අභිමිවීම් සහ හානි වලින් වළක්වාගැනීම උදෙසා ඔබ විසින් සියළු අවස්ථාවන්හිදී, සියළු සාධාරණ පියවර ගත යුතුය. ඔබේ වාහනය මාර්ග ධාවනයට සුදුසු තත්වයෙන් නඩත්තු කල යුතුය.

**2. ඔප්පු කොන්දේසි පිළිපැදීමේ වගකීම**

මෙම ඔප්පුවේ කොන්දේසි, විධිවිධාන, වගන්ති, වගකීම් සහ පිටසන් කිරීම් සම්පූර්ණ කිරීම සහ පිළිපැදීම මත පදනම්ව මෙම ඔප්පුවෙන් ලබාදෙන ආවරණය කොන්දේසි සහිත වේ.

**3. ඔප්පුව යාවත්කාලීන කිරීම**

ලබාදී ඇති තොරතුරු වල ඕනෑම වෙනසක් වහා දනුම් දිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත් වුවහොත් එය ඔබේ හිමිකම් ඉල්ලුමේ ප්‍රතිලාභයට බලපෑ හැකි අතර, ඇතැම්විට කිසිදු හිමිකමක් ලබාගැනීමට නොහැකිවනු ඇත.

ඉදිරිපත් කර ඇති තත්වයන්හි කැපී පෙනෙන වෙනසක් සිදුවුවහොත් එය ඔබේ ඔප්පුව අවලංගු කිරීමටද හේතුවිය හැක. තත්වයන්හි තොරතුරු වෙනසක් යනු රක්ෂණයට පදනම් වූ යෝජනා පත්‍රයෙන් ඔබ දැනටමත් ඉදිරිපත් කර ඇති කරුණු ඔප්පුවේ කරුණුවලට පරස්පර විරෝධී වීමකි.

**4 ව්‍යාජ හිමිකම් අයදුම් වගන්තිය**

ඕනෑම හිමිකම් අයදුමක් කවරාකාරයකින් හෝ වංචාසහගතව ඉදිරිපත් කර ඇති විට හෝ රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින අයකු ඉහළ නැංවූ හෝ ප්‍රමාණය ඉක්මවා දැක්වූ හිමිකම් අයදුමක් ව්‍යාජ හෝ වංචාසහගත ලේඛන ඉදිරිපත් කර ඇතිවිට හෝ රක්ෂිතයාගේ යෝජනා පත්‍රයේ සපයා ඇති කරුණු හෝ වෙනත් ලේඛන ව්‍යාජ බව හෝ යම් තොරතුරක් සඟවා ඇති බව ඔප්පු වුවහොත් මෙම ඔප්පුව යටතේ සියළු වරප්‍රසාද අත්හිටවනු ලබන අතර, ඔප්පුව එහි ආරම්භයේ සිටම අවලංගු කරනු ලැබේ.

**5 පොලිස් වාර්තා / හිමිකම් අයදුම් දැන්වීම**

මෙම ඔප්පුවේ අනෙකුත් වගන්තිවලට පටහැනි නොවන පරිදි, ලේඛනයේ දක්වා ඇති වාහනයකට ඔප්පුව යටතේ සමාගමට නීතිමය වගකීමක් පැවරිය හැකි හානියක් සිදුවූ විට 1951 අංක 14 දරන මෝටර් වාහන ආඥා පණතේ සහ එහි සංශෝධනවල දක්වා ඇති පරිදි, පැය 24 ක කාලයක් තුල ලඟම ඇති පොලිස් ස්ථානය වෙත වාර්තා කල යුතුය. එමෙන්ම සමාගම වෙතද වහා දැනුම්දීමක් සිදුකල යුතු වේ. එසේම සමාගමේ පූර්ව අනුමැතියකින් තොරව වාහනයේ අළුත්වැඩියාවන් කිසිවක් ආරම්භ කිරීම, කිසිදු කොටසක් විනාශ කිරීම හෝ එවැනි වාහනයක් අළුත්වැඩියා කිරීමේ ඇස්තමේන්තු ලබාගැනීම සිදු නොකළ යුතුය.

**6 රක්ෂණය පැවරීම**

රක්ෂණ සහතිකය පැවරීම සමාගම විසින් පිළිගනු ලබන්නේ මෝටර් වාහන පණතේ 112 (a) වගන්තියට අනුව පැවරීම සිදුකර දින 44 ක කාලයක් ඇතුලත වන අතර, 1951 අංක 14 දරන මෝටර් වාහන ආඥා පණතට අනුව එහිදී තුන්වන පාර්ශ්වයේ වගකීම් සහිත රක්ෂණාවරණයක් ලබාගැනීම අනිවාර්ය වේ. මෙම පිළිගැනීම මෙම රක්ෂණ ඔප්පුවේ පරිපූර්ණ රක්ෂණාවරණය යටතේ පිරිනමන අනෙකුත් ආවරණ සහ දිගුවන් සඳහා වලංගු නොවේ.

වාහනය පවරනු ලැබූ පුද්ගලයා විසින් රක්ෂණ හිමිකම් ලැබිය හැකි ආපදාවකදී සිදුවූ අලාභ හානි වෙනුවෙන් රක්ෂණ වන්දි ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම්, පැවරීමේ නීතිමය ලේඛන සහ වාහනය ලැබුන වහාම සමාගම ඇමතිය යුතුය. එහිදී ඔහු විසින් සමාගමේ ලිපිනයට යොමුකළ ලේඛනයක් මඟින් නියමිත හෙළිදරව් කිරීම සහ ප්‍රකාශ සිදුකිරිම අවශ්‍යතාවකි. එසේ කිරීමට අපොහොසත් වන්නන්ගේ රක්ෂණාවරණය, වාහනය නව හිමිකරු වෙත පැවරූ දිනයේ සිට, අක්‍රිය වනු ඇත.

## අන්තර්ගතය


රක්ෂණ ගිවිසුම

ආවරණ අවකාශය

පළමු කොටස - වාහනයට හානියක් සිදුවීම හෝ අහිමිවීම
හිමිකම් අයදුම් නොකිරීමේ පාරිතෝෂිකය

දෙවන කොටස - තුන්වන පාර්ශ්වයන් සඳහා නීතිමය වගකීම්
පුද්ගලික මෝටර් රථ
යතුරුපැදි
අනිකුත් සියළු වාහන

තුන්වැනි කොටස - වෛද්‍ය වියදම් (පුද්ගලික මෝටර් රථ සඳහා පමණි)

ඇතැම් කොන්දේසි මඟ හැරීම සහ ආපසු ලබාගැනීමේ අයිතිය.

සාමාන්‍ය හැරදැමීම් (සියළු වාහන සඳහා බලපැවැත්වේ.)

තත්වයන්

බේරුම් කිරීම

වගන්ති සහ පිටසන්

වගන්තිය 1 - තුන්වැනි පාර්ශ්වයට පමණි.
වගන්තිය 2 - තුන්වැනි පාර්ශ්වය, ගිණි සහ සොරකම්
වගන්තිය 3 - ජල ගැලීම් සහ ස්වභාවික ආපදා
වගන්තිය 4 - වර්ජන, කැරළි, සහ මහජන කැළඹීම්
වගන්තිය 5 - ත්‍රස්තවාදය
වගන්තිය 6 - සේවක වන්දි
වගන්තිය 7 - සේවක වන්දි - ත්‍රස්තවාදී ආවරණය
වගන්තිය 8 - ඇදගෙන යාමේ ගාස්තු
වගන්තිය 9 - වායු මළු, (Air Bag) දිගුව
වගන්තිය 10 - විදුරු, වින්ඩ්ස්ක්‍රීන්/ජනේල බිඳීම
වගන්තිය 11 - තුන්වැනි පාර්ශ්වය දේපළ හානි
වගන්තිය 12 - පුද්ගලික අනතුරු ප්‍රතිලාභ
වගන්තිය 13 - මගී අවදානම් (වාණිජ වාහන පමණි)
වගන්තිය 14 - අයත් නොවන අයිතම (කුලී වාහන පමණි)
වගන්තිය 15 - කුලී වාහන (කුලියට ලබාගත් අය පදවන)
වගන්තිය 16 - සංචරණ භාණ්ඩ (අනතුරුදායක නොවන)
වගන්තිය 17 - සංචරණ භාණ්ඩ (අනතුරුදායක )
වගන්තිය 18 - සංචරණ භාණ්ඩ (ත්‍රස්තවාදී ආවරණය)
වගන්තිය 19 - මාර්ග බලපත්‍ර සහිත ඔම්නි බස්රථ
වගන්තිය 20 - කොටස් සොරකම් ආවරණය (පුද්ගලික ද්විත්ව කාර්ය වාහන පමණි)
වගන්තිය 21 - පුහුණුවන රියදුරු/යතුරුපැදිකරු
වගන්තිය 22 - කුලී සින්නක්කර/කල්බදු
වගන්තිය 23 - රියදුරු පුහුණුව
වගන්තිය 24 - ආයතනික ණය
වගන්තිය 25 - ස්වේච්ඡා අතිරික්තය (සියළු හිමිකම් අයදුම් සඳහා)
වගන්තිය 26 - අනිවාර්ය අතිරික්තය
වගන්තිය 27 - තීරු බදු රහිත වාහන

# මෝටර් රථ රක්ෂණාවරණය

මෙම ලේඛනයේ සඳහන් රක්ෂිතයා (මින් පසු එලෙස හඳුන්වනු ලබන) යෝජනා කර ප්‍රකාශයට පත් කළ සම්බන්ධතාව මත පදනම්ව ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන්,

**LOLC ජෙනරල් ඉන්ෂුරන්ස් ලිමිටඩ්**

(මින් ඉදිරියට සමාගම ලෙස හඳුන්වනු ලබන) රක්ෂණාවරණයක් සඳහා අයදුම් කර ඇති අතර අදාළ ලේඛනයේ සඳහන් කාල පර්ච්ඡේදය තුළ හෝ සමාගම විසින් කාලය දීර්ඝ කිරීම සඳහා ගෙවීම් පිළිගනු ලබන "ආවරණය බල සහිත" යම් කාලයක් තුළ සිදුවන අනතුරක් නැතිවීමක් හෝ හානියක් වෙනුවෙන්, රක්ෂණ හිමිකම් සලකා බැලීමට අදාළ ලේඛනයේ සඳහන් වාරිකය ගෙවා හෝ ගෙවීමට පොරොන්දු වී ඇත.

**දැන් මෙම ඔප්පුව සාක්ෂි සහිතව ස්ථාපිතයි:**

එය මෙහි දක්වා ඇති පිටසන් කර ඇති වෙනත් ආකාරයකින් සඳහන් කර ඇති වගන්ති බැහැරකිරීම් සහ කොන්දේසි වලට යටත් වේ.

**01 වන කොටස :**

**වාහනයට හානි සිදුවීම හෝ නැතිවීම**

1. සමාගම විසින් ලේඛනයේ/ලේඛන වල සඳහන් ඕනෑම මෝටර් වාහනයකට හෝ එහි අමතර කොටස් වලට පහත සඳහන් අවස්ථාවලදී සිදුවන නැතිවීමකට හෝ හානියකට වන්දි හිමිකම් ලබාදෙයි.

   I. බාහිරව සිදුවන අනතුරු

   II. ගිණි, බාහිර පිපිරීම, ස්වයං ගිණි ගැනීම, අකුණු, නිවාස බිඳීම, හෝ සොරකම

   III. ද්වේශ සහගත ක්‍රියා

   IV. ගොඩබිම් මාර්ග, දුම්රිය මාර්ග, අභ්‍යන්තර ජල මාර්ග සෝපාන හෝ ඔසවනයන් මඟින් ප්‍රවාහනය කිරීමේදී

**නමුත් පහත දැක්වෙන අවස්ථාවලින් බාහිරව:**

i. (a) වාහනයක් වෙනත් හානියකට ලක්වූ අවස්ථාවේදි හැර ටයර්, ටියුබ් සහ එන්ජින් උපාංග වලට සිදුවන හානි; එවැනි අවස්ථාවකදී ටයර් ටියුබ් සහ එන්ජින් උපාංග වලට සිදුවන හානි සඳහා සමාගමේ වගකීම ඒවා නැවත යෙදීම සඳහා වැයවන මුදලින් 50% නොඉක්මවිය යුතුය.

(b) මැලියම් සීලන්ට් ඇතුළු පාවිච්චිය නිසා වැඩිපුර ගෙවී යන සියළු උපාංග නැවත යෙදවීමේ වියදමට අදාළ සමාගමේ වගකීම ඉන් 50% නොඉක්මවිය යුතුය.

ii. වාහනය පෞද්ගලික මෝටර් රථයක් ලෙස රක්ෂණය කර ඇති අවස්ථාවන්හිදී හැර උපාංග, අමතර කොටස් හෝ අභ්‍යන්තර කොටස් නැතිවීම හෝ ඒවාට හානි සිදුවීම සඳහා වන්දි හිමිවන්නේ සොරකමකින්, නිවාස බිඳීමකින්, පැහැර ගැනීමකින්, වාහනය සොරාගත් අවස්ථාවකදී පමණි.

iii. යතුරු පැදි හැර අනිකුත් වාහනවල වායුමළ සඳහා වන්දි හිමිකම් ලබාදෙන්නේ වාහනයට වෙනත් හානියක්ද සිදුවූ අවස්ථාවේදී වන අතර, එවැනි අවස්ථාවකදී සමාගමේ වන්දි වගකීම ඒවා නැවත යෙදීම සඳහා වැයවන මුදලින් 50% නොඉක්මවන ප්‍රමාණයකි.

iv. බස්රථ පොදුබස්රථ හා මෝටර් කෝච් ලෙස ලියාපදිංචි කල රථවල වින්ඩ්ස්ක්‍රීන් සහ ජනේල සඳහා වන්දිය

   a) උපාංග සහ අමතර කොටස් ඇතුළුව රක්ෂිතයාගේ ඇස්තමේන්තු අගයෙන් හෝ

b) අනතුර සිදුවන අවස්ථාවේ වාහනයේ සැබෑ වටිනාකමින් 10% නොඉක්මවන අගය

අතුරින් අඩු අගයයි.

v. කුලී හෝ බදු පදනම මත යෙදවීම සඳහා ලබාගත් රක්ෂිත වාහනවල ලාම්පු, ටයර්, බෆර්, මඩ්ගාඩ්, බෆර් ඇමිණුම්, බෆර් ආරක්ෂණ සහ තීන්ත ආලේප කිරීමේ වියදම්

2. (a) පෞද්ගලික මෝටර් රථ සහ යතුරු පැදි සඳහා අනියම් හෝ චක්‍රාකාර අහිමිවීම්, අගය අඩුවීම, පාවිච්චිය නිසා ගෙවීයාම, කාර්මික හෝ විදුලි බිඳ වැටීම් හෝ තිරිංග ක්‍රියානොකිරිම නිසා සිදුවන හානි සඳහා කිසිදු ගෙවීමක් සිදුකිරීමට සමාගම බැඳී නොසිටි.

(b) පෞද්ගලික මෝටර් රථ සහ යතුරු පැදි හැර අනෙකුත් සියලුම වාහනවල, අනියම් හෝ චක්‍රාකාර අහිමිවීම්, අගය අඩුවීම, පාවිච්චිය නිසා ගෙවීයාම, කාර්මික හෝ විදුලි බිඳ වැටීම් හෝ තිරිංග ක්‍රියානොකිරිම, අධික බර පැටවීම නිසා ඇතිවන ආතතිය භාණ්ඩ තොගයේ ස්වභාවය නිසා ඇතිවන හානි සඳහා කිසිදු ගෙවීමක් සිදුකිරීමට සමාගමට වගකීමක් නොමැත.

3. සියළු අවස්ථාවන්හිදී - සෑම සිදුවීමකදීම, මේ යටතේ ඇති ඕනෑම වැයකිරීමකදී පහත සඳහන් කර ඇති ප්‍රමාණයන් (හෝ දැරීමට සිදුවන ඊට අඩු පිරිවැයක්) රක්ෂිතයා විසින් දැරිය යුතුය. සමාගම විසින් දරන ලද පිරිවැයට, රක්ෂිතයා විසින් දැරිය යුතු ප්‍රමාණයද ඇතුලත් නම්,එම මුදල රක්ෂිතයා විසින් සමාගම වෙත වහා ගෙවිය යුතුය. මෙම උප කොටස යටතේ සිදුවීමක් යනු ආවරණය සලසා ඇති එක් වාහනයකට අදාළ එක් හේතුවක් නිසා ඇතිවන සිදුවීම් පෙළක් විය හැක.

| | | |
|---|---|---|
| * | පෞද්ගලික මෝටර් රථ | ගෙවීමක් නොමැත |
| * | යතුරු පැදි | පළමු රු.2000 සහ රු.4000 ඉන්පසු ඕනෑම් ඔප්පු කාලයක් තුළ |
| * | සියළු කුලී වාහන | පළමු රු 1000 |
| * | සියළු බදු වාහන | පළමු රු 5000 |
| * | සියළු බදු යතුරු පැදි | පළමු රු 2000 |

* වාහනය නිපදවූ දින සිට කාලය අනුව අනිවාර්ය අමතර වැය
    a) වසර 10 ට වැඩි - නොමැත
    b) වසර 15 ට වැඩි - රු.2000
    c) වසර 20 ට වැඩි - රු.5000

4. මෙම ඔප්පුව යටතේ ආවරණය සලසන මෝටර් වාහනය අලාභ හානි වීම මඟින් අක්‍රිය තත්වයට පත්වූ විට එය සමාගම විසින් අනුමත කල ළඟම ඇති ගරාජය වෙත සහ නැවත රක්ෂිතයා වෙත රැගෙන යාම සඳහා වැයවන මුදලෙන් සාධාරණ කොටසක් සමාගම විසින් දරනු ලබන අතර එය යතුරුපැදි සඳහා රු 500 සහ අනෙකුත් සියළු වාහන සඳහා රු 1000 නොඉක්මවන මුදලක් විය යුතුය. අනිකුත් සියළු වාහන සඳහා ඕනෑම එක් අනතුරකදී ඔප්පු ලේඛනයේ සඳහන් කර ඇති මුදල බලපැවැත්වේ.

5. (a) මෙම ඔප්පුව යටතේ සමාගමට වගකීම් පැවරෙන ආකාරයේ හානියක් මෝටර් රථයට සිදුවූ විට වාහනය සහ ඊට සිදු වූ හානිය නිසි ලෙස හඳුනාගත හැකි පරිදි සමාගම වෙත වහා ලිඛිතව දැනුම් දිය යුතුය. සමාගමේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව එහි කිසිදු කාර්යක් ආරම්භ කිරීම, මෝටර් රථයේ කිසිදු කොටසක් විනාශ කිරීම හෝ අලුත්වැඩියාව සඳහා වියදම් ඇස්තමේන්තු රක්ෂිතයා විසින් ලබා නොගත යුතුය.

(b) මෙහිදී හානියට පත් වාහනයේ නිසි හඳුනාගැනීමේ සලකුණු ලෙස එහි ලියාපදිංචි අංකය සහ/හෝ චැසි අංකය සැපයිය යුතුය.

**හිමිකම් අයදුම් නොකිරීමේ ප්‍රසාද (‘NCB’)**

රක්ෂිත කාලසීමාව තුළ හිමිකම් අයදුම් නොකලේ නම් හෝ වන්දි හිමිකම් අවශ්‍යතාවක් මතු නොවුයේ නම්, ඔප්පුව අළුත් කිරීමේදී, පහත දැක්වෙන ප්‍රසාද හිමිවන අතර, එම රක්ෂණාවරණ කාලසීමාව සඳහා නැවත අළුත් කිරීමේ ගාස්තුව පහත දැක්වෙන පරිදි අඩු කෙරේ.

| | යතුරු පැදි | අනිකුත් වාහන |
|---|---|---|
| අළුත්කිරීම 1 | 15% | 20% |
| අළුත්කිරීම 2 | 20% | 30% |
| අළුත්කිරීම 3 | 25% | 40% |
| අළුත්කිරීම 4 | 30% | 50% |
| අළුත්කිරීම 5 | 35% | 60% |
| අළුත්කිරීම 6 | | 70% |
| අළුත්කිරීම 7 | | 75% |

මෙම ඔප්පුවේ කාලසීමාව තුළ එහි හිමිකම් පැවරීමට සමාගම එකඟ වුවද, අදාළ වරප්‍රසාද ලබන්නා වෙත හුවමාරු නොවේ.

ලේඛනයේ සඳහන් එක් වාහනයකට වැඩියෙන් රක්ෂණය කර ඇත්නම් N. C. B. අදාළ වන්නේ එක් එක් වාහනයට වෙන් වෙන්ව ඔප්පු නිකුත් කර ඇත්නම් පමණි.

## 02 වන කොටස :
## තුන්වන පාර්ශ්වය සඳහා වගකීම්

### A. පුද්ගලික මෝටර් රථ සඳහා පමණි

1. රක්ෂිතයා වෙතින් සිදුවූ හෝ ලේඛනයේ සඳහන් ඕනෑම මෝටර් රථයක් මගින් සිදුවූ අනතුරකදී ඔප්පුවේ සඳහන් වගකීම් සීමාවන්ට යටත්ව, වන්දි අපේක්ෂිතයාගේ වියදම් ඇතුළු රක්ෂිතයා නීතිමය වශයෙන් ගෙවීමට බැඳී සිටින වියදම් ඇතුළුව මුළු එකතුව සඳහා සමාගම වන්දි වගකීම දරයි.
   - a) රැකියාවට අදාළ ක්‍රියාමාර්ගයකදී සහ මෝටර් රථයක් රැගෙන යන රක්ෂිතයාගේ නිවසේ සාමාජිකයකු හැර රක්ෂිතයා වෙතින් ඕනෑම පුද්ගලයෙකුට මරණය හෝ ශාරීරික තුවාල සිදුවීම
   - b) රක්ෂිතයාට අයත් හෝ භාරයක් මගින් හෝ ආරක්ෂක භාරයේ රඳවා ගෙන සිටින හෝ රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ ගෘහස්ථ සාමාජිකයකුගේ පාලනය යටතේ පවතින දේපළ හැර අනෙකුත් දේපළ වලට සිදුවන හානි.
2. සමාගම විසින් ලිඛිත එකඟතාව අනුව ගෙවීමට සිදුවන සියළු වැය සහ වියදම් ගෙවනු ලැබේ.
3. මෙම කොටසේ සඳහන් වන්දි මුදලේ සීමාවන් පිළිබඳ කොන්දේසි වලට අනුව සමාගම වන්දි ගෙවනු ලබන්නේ එවැනි මෝටර් රථයක් පදවන පහත දැක්වෙන පුද්ගලයකු සඳහා පමණි.
   - a) වෙනත් ඕනෑම රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් ලැබීමට සුදුසුකම් නොලබන
   - b) ඔහු රක්ෂිතයා වන නමුදු හිමිකම් අයදුම් කිරීමට ඔප්පුවේ වගන්ති, කොන්දේසි, සහ අපේක්ෂාවන් සපුරාලිය යුතු අතර ඊට යටත් වේ.
4. මෙම කොටස යටතේ වන්දි පිරිනැමීමට රක්ෂිතයා විසින්ම ඔහුට අයත් නොවන සහ/හෝ කුලී සිත්නක්කර ගිවිසුමකින් කුලියට නොගත් ලේඛනයේ සඳහන් පුද්ගලික මෝටර් රථයක් (යතුරු පැදියක් නොව) පදවන අවස්ථාවක සමාගම වන්දි ගෙවයි. (ආයතන මගින් රක්ෂණය කරන ලද වාහන සඳහා මෙය අදාළ නොවේ.)

5. මෙම කොටස යටතේ වන්දි හිමිකම් ලැබීමට සුදුසුකම් ලබා සිටින ඕනෑම පුද්ගලයකුගේ මරණයකදී , එවැනි පුද්ගලයකුගේ පෞද්ගලික නියෝජිතයකුට ඇතිවී තිබෙන වගකීම් වලට ගරුකරමින් සමාගම වන්දි ගෙවයි. එය ඔප්පුවේ මෙම කොටසේ සඳහන් වන්දි හිමිකම් සීමා කොන්දේසි වලට අනුව රක්ෂිතයා විසින් ඔප්පුවේ කොන්දේසි, සපුරාලීම මත සිදු කෙරෙන්නකි.

6. මෙම කොටස යටතේ වන්දි පිරිනැමීමට අදාළ ඕනෑම මරණ පරික්ෂණයකදී සිය නියෝජිතයකු ඉදිරිපත් කිරීමේ විකල්පය සමාගම සතුවන අතර , වන්දි ගෙවීමට අදාළ යම් සිද්ධියකට සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක හෝ පළමුව එය ඉදිරිපත් කෙරෙන අධිකරණදී නිදහසට කරුණු දැක්වීමේ ක්‍රියාවලියට එක්වීමට අවස්ථාව තිබේ.

**නීතිමය වගකීමේ සීමා**
**පුද්ගලික මෝටර් රථ**

2 (A) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

**1. (a) - අසීමිත**

2 (A) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

**1. (b) - අසීමිත**

එක් සිද්ධියකින් පැන නගින ඕනෑම එක් හිමිකම් අයදුමක් හෝ අයදුම් පෙළකට අදාළව

**B. යතුරු පැදි සඳහා පමණයි**

1. රක්ෂිතයා වෙතින් සිදුවූ හෝ ලේඛනයේ සඳහන් ඕනෑම යතුරුපැදියක් මගින් සිදුවූ අනතුරකදී ඔප්පුවේ සඳහන් වගකීම් සීමාවන්ට යටත්ව, වන්දි අපේක්ෂිතයාගේ වියදම් ඇතුළු රක්ෂිතයා නීතිමය වශයෙන් ගෙවීමට බැඳී සිටින වියදම් ඇතුළුව මුළු එකතුව සඳහා සමාගම වන්දි වගකීම දරයි.
   a. රැකියාවට අදාළ ක්‍රියාමාර්ගයකදී සහ යතුරුපැදියේ රැගෙන යන රක්ෂිතයාගේ නිවසේ සාමාජිකයකු හැර, රක්ෂිතයා වෙතින් ඕනෑම පුද්ගලයෙකුට මරණය හෝ ශාරීරික තුවාල සිදුවීම. යතුරුපැදිය මත හෝ රැගෙන යන වෙනත් පුද්ගලයන් ඊට අයත් නොවේ.
   b. රක්ෂිතයාට අයත් හෝ භාරයක් මගින් හෝ ආරක්ෂක භාරයේ රඳවා ගෙන සිටින හෝ රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ ගෘහස්ථ සාමාජිකයකුගේ පාලනය යටතේ පවතින දේපළ හෝ යතුරුපැදියේ රැගෙන යන හෝ රැගෙන යන පුද්ගලයකුගේ හැර අනෙකුත් දේපළ වලට සිදුවන හානි.

පහත දැක්වෙන අවස්ථාවන්හිදී සමාගම, නීතිමය වගකීමක් නොදරයි. ගමන් මග ඔස්සේ ඕනෑම අවස්ථාවක යතුරු පැදියේ සීමාවන් ඉක්මවීම නිසා සිදුවන මරණ, තුවාල හෝ හානි එවැනි යතුරු පැදියකට බර පැටවීමේදී, රැගෙන යාමේදී, හෝ ගොඩබෑමේදී හෝ ඉවතට ගෙනයාමේදී සිදුවන අනතුරු

2. සමාගම විසින් ලිඛිත එකඟතාව අනුව ගෙවීමට සිදුවන සියළු වැය සහ වියදම් ගෙවනු ලැබේ.

3. මෙම කොටසේ සඳහන් වන්දි මුදලේ සීමාවන් පිළිබඳ කොන්දේසි වලට අනුව සමාගම වන්දි ගෙවනු ලබන්නේ එවැනි යතුරු පැදියක් පැදවූ පුද්ගලයා පහත දැක්වෙන පුද්ගලයකු නම් පමණි.

   (a) වෙනත් ඕනෑම රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් ලැබීමට සුදුසුකම් නොලබන අයෙකු විය යුතු අතර,

   (b) ඔහු රක්ෂිතයා වන නමුදු හිමිකම් අයදුම් කිරීමට ඔප්පුවේ වගන්ති, කොන්දේසි,

සහ අපේක්ෂාවන් සපුරාලිය යුතු අතර ඊට යටත් වේ.

4. මෙම කොටස යටතේ වන්දි හිමිකම් ලැබීමට සුදුසුකම් ලබාසිටින ඕනෑම පුද්ගලයකුගේ මරණයකදී , එවැනි පුද්ගලයකුගේ පෞද්ගලික නියෝජිතයකුට ඇතිවී තිබෙන වගකීම් වලට ගරුකරමින් සමාගම වන්දි ගෙවයි. එය ඔප්පුවේ මෙම කොටසේ සඳහන් වන්දි හිමිකම් සීමා කොන්දේසි වලට අනුව රක්ෂිතයා විසින් ඔප්පුවේ කොන්දේසි, සපුරාලීම මත සිදු කෙරෙන්නකි.
5. මෙම කොටස යටතේ වන්දි පිරිනැමීමට අදාළ ඕනෑම මරණ පරික්ෂණයකදී සිය නියෝජිතයකු ඉදිරිපත් කිරීමේ විකල්පය සමාගම සතුවන අතර, වන්දි ගෙවීමට අදාළ යම් සිද්ධියකට සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක හෝ පළමුව එය ඉදිරිපත් කෙරෙන අධිකරණදී නිදහසට කරුණු දැක්වීමේ ක්‍රියාවලියට එක්වීමට අවස්ථාව තිබේ.

**නීතිමය වගකීමේ සීමා**
**යතුරුපැදි සඳහා**

2 (B) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

1. (a) - අසීමිත

2 (B) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

1. (b) – රු.15,000

එක් සිද්ධියකින් පැනනගින ඕනෑම එක් හිමිකම් අයදුමක් හෝ අයදුම් පෙළකට අදාළව

**C. පුද්ගලික මෝටර් රථ සහ යතුරුපැදි හැර අනිකුත් සියළු වාහන සඳහා බලපවත්වයි.**

1) (i) රක්ෂිතයා වෙතින් සිදුවූ හෝ ලේඛනයේ සඳහන් ඕනෑම වාහනයක් මඟින් සිදුවූ අනතුරකදී ඔප්පුවේ සඳහන් වගකීම් සීමාවන්ට යටත්ව, වන්දි අපේක්ෂිතයාගේ වියදම් ඇතුළු රක්ෂිතයා නීතිමය වශයෙන් ගෙවීමට බැඳී සිටින වියදම් ඇතුළුව මුළු එකතුව සඳහා සමාගම වන්දි වගකීම දරයි.

a. ලේඛනයේ (වල) සඳහන් වාහනයක් භාවිතා කිරීමේදී සිදුවන හෝ පැනනගින ඕනෑම පුද්ගලයකුගේ මරණය හෝ ශාරීරික තුවාල (එවැනි වාහනයක් පැටවීමේදී සහ/හෝ ගොඩබෑමේදී ඇතුළුව)

b. ලේඛනයේ (වල) සඳහන් වාහනයක් භාවිතා කිරීමේදී දේපළවලට සිදුවන හානිය (එවැනි වාහනයක් පැටවීමේදී සහ / හෝ ගොඩබෑමේදී ඇතුළුව)

(ii) පහත දැක්වෙන අවස්ථාවන්හිදී සමාගම, නීතිමය වගකීමක් නොදරයි.

a. ගමන් මග ඔස්සේ ඕනෑම අවස්ථාවක යතුරු පැදියේ සීමාවන් ඉක්මවීම නිසා සිදුවන මරණ, තුවාල හෝ හානි එවැනි යතුරු පැදියකට බර පැටවීමේදී, රැගෙන යාමේදී, හෝ ගොඩබෑමේදී හෝ ඉවතට ගෙනයාමේදී සිදුවන අනතුරු.
b. රක්ෂිතයාගේ රැකියාවට අදාළ ක්‍රියාමාර්ගයකදී ඕනෑම පුද්ගලයෙකුට මරණය හෝ ශාරීරික තුවාල සිදුවීම.
c. එවැනි වාහනයක් මඟින් රැගෙන යනු ලබන (හේතු සහිතව හෝ රැකියා කොන්දේසි මත රැගෙන යන මගියකු හැර) එවැනි වාහනයකට ඇතුළුවීමේදී හෝ ගොඩවීමේදී හෝ බැසයාමේදී ඇතිවූ හිමිකම් ඉල්ලීමට හේතුවන සිද්ධියේදී ඕනෑම

පුද්ගලයකුට ඇතිවන මරණයක් හෝ ශාරීරික තුවාල.

d. රක්ෂිතයාට අයත් හෝ භාරයක් මඟින් හෝ ආරක්ෂක භාරයේ රඳවා ගෙන සිටින හෝ රක්ෂිතයාගේ හෝ රක්ෂිතයාගේ ගෘහස්ථ සාමාජිකයකුගේ හෝ එවැනි වාහනයක රැගෙන යන පුද්ගලයකුගේ පාලනය යටතේ පවතින දේපළ.

e. එවැනි වාහනයකින් ඇතිවන කම්පනයකින්, බර නිසා හෝ රැගෙන යනු ලබන බර හේතුවෙන් පාලමකට, කිරුම් පාලමකට, බෝක්කුවකට, මාර්ගයකට හෝ පහලින් වූ ඕනෑම දෙයකට සිදුවන ඕනෑම හානියක්.

f. එවැනි වාහනයක පුලිඟු හෝ අළු මඟින් හෝ වාහනයේ බොයිලේරුව පිපිරීම නිසා පැනනගින දේපළ හානි.

g. ලේඛනයේ මහාමාර්ගයක් ලෙස හදුන්වා ඇති මාර්ගයක වාහනය භාවිතා කරන අවස්ථාවක හැර, එවැනි වාහනයක බොයිලේරුව පිපිරීම නිසා සිදුවන මරණ හෝ ශාරීරික තුවාල.

2) සමාගම විසින් ලිඛිත එකඟතාව අනුව ගෙවීමට සිදුවන සියළු වැය සහ වියදම් ගෙවනු ලැබේ.

3) මෙම කොටසේ සඳහන් වන්දි මුදලේ සීමාවන් පිළිබඳ කොන්දේසි වලට අනුව සමාගම වන්දි ගෙවනු ලබන්නේ එවැනි වාහනයක් පැදවූ පුද්ගලයා පහත දැක්වෙන පුද්ගලයකු නම් පමණි.

a. වෙනත් ඕනෑම රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් ලැබීමට සුදුසුකම් නොලබන අයෙකු විය යුතු අතර,

b. ඔහු රක්ෂිතයා වන නමුදු හිමිකම් අයදුම් කිරීමට ඔප්පුවේ වගන්ති, කොන්දේසි, සහ අපේක්ෂාවන් සපුරාලිය යුතු අතර ඊට යටත් වේ.

4) මෙම කොටස යටතේ වන්දි හිමිකම් ලැබීමට සුදුසුකම් ලබාසිටින ඕනෑම පුද්ගලයකුගේ මරණයකදී , එවැනි පුද්ගලයකුගේ පෞද්ගලික නියෝජිතයකුට ඇතිවී තිබෙන වගකීම් වලට ගරුකරමින් සමාගම වන්දි ගෙවයි. එය ඔප්පුවේ මෙම කොටසේ සඳහන් වන්දි හිමිකම් සීමා කොන්දේසි වලට අනුව රක්ෂිතයා විසින් ඔප්පුවේ කොන්දේසි, සපුරාලීම මත සිදු කෙරෙන්නකි.

5) මෙම කොටස යටතේ වන්දි පිරිනැමීමට අදාළ ඕනෑම මරණ පරික්ෂණයකදී සිය නියෝජිතයකු ඉදිරිපත් කිරීමේ විකල්පය සමාගම සතුවන අතර, වන්දි ගෙවීමට අදාළ යම් සිද්ධියකට සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක හෝ පළමුව එය ඉදිරිපත් කෙරෙන අධිකරණදී නිදහසට කරුණු දැක්වීමේ ක්‍රියාවලියට එක්වීමට අවස්ථාව තිබේ.

**නීතිමය වගකීමේ සීමා**
**පුද්ගලික මෝටර් රථ සහ යතුරුපැදි හැර අනිකුත් සියළුම වාහන සඳහා**

2 (C) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

1. (a) - අසීමිත

2 (C) කොටස යටතේ සමාගමේ වගකීමේ සීමාවන්

1. (b) – රු.15,000

එක් සිද්ධියකින් පැනනගින ඕනෑම එක් හිමිකම් අයදුමක් හෝ අයදුම් පෙළකට අදාළව.

### තුන්වන කොටස:
### වෛද්‍ය ප්‍රතිකාර සඳහා වියදම් (පෞද්ගලික මෝටර් රථ සඳහා පමණක් වලංගු වේ.)

ලේඛනයේ දැක්වෙන ඕනෑම මෝටර් රථයක ගමන් ගන්නා රක්ෂිතයා හෝ වෙනත් පුද්ගලයෙකුට ශාරීරිකව සිදුවන තදබල, හදිසි, බාහිර සහ දෘශ්‍යමාන තුවාල සිදුවීම් සඳහා වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් රක්ෂිතයා වෙත සමාගම සාධාරණ ගෙවීමක් සිදු කරයි. එහෙත් එවැනි මෝටර් රථයකට සිදුවන අනතුරක සෘජු ප්‍රතිඵලයක් ලෙස තුවාල ලබන, මුදල් ගෙවා යොදවන රියදුරෙකු, සහායකයකු හෝ ක්ලිනර්වරයෙකු සඳහා මෙම කාණ්ඩය යටතේ එක් සිද්ධියකදී සමාගම විසින් ගෙවනු ලබන මුළු මුදල රුපියල් 1500 කි.

### ඇතැම් කොන්දේසි මගහැරීම සහ නැවත අයකරගැනීමේ අයිතිය

මෙම ඔප්පුවේ කිසිවක් හෝ කිසිදු වගන්තියක් එමගින් වන්දි ලැබීම සඳහා ඕනෑම පුද්ගලයෙකුට ඇති අයිතියට හෝ 1951 (සංශෝධිත) අංක 14 දරන මෝටර් වාහන පණතේ 102 සහ 105 කොටස් වල විධි විධාන යටතේ යම් මුදලක් ලබාගැනීමට වෙනත් ඕනෑම පුද්ගලයෙකුට පවතින අයිතියට බලපෑමක් සිදු නොකරයි.

එහෙත් සමාගම විසින් නීතිමය වගකීමක් නොදරන එම වගන්ති යටතේ ගෙවනු ලැබූ සියළු මුදල් රක්ෂිතයා විසින් නැවත සමාගම වෙත ගෙවිය යුතුය.

### වන්දි ලැබීමේ සීමාවන් පිළිබඳ අයදුම් කිරීම (පුද්ගලික මෝටර් රථ සහ යතුරුපැදි හැර අනිකුත් සියළුම වාහන සඳහා)

එක් පුද්ගලයකුට වඩා වන්දි ලැබීමට සම්බන්ධ ඕනෑම අනතුරකදී මෙම ඔප්පුවේ හෝ එහි වගන්තියක් මඟින් දක්වා ඇති කොන්දේසි යටතේ සීමාවන් පනවා ඇත්නම් වන්දි ලැබිය යුතු සියළු පුද්ගලයන් වෙනුවෙන් මුළු වන්දි මුදල සඳහා අයදුම් කල යුතු අතර, එවැනි වන්දි ඉල්ලීමක් රක්ෂිතයාට ප්‍රමුඛත්වය හිමිවන පරිදි ඉදිරිපත් කල යුතුය.

### පොදු බැහැරකිරීම්
### (සියළු වාහන සඳහා අදාළ වේ)

මෙම ඔප්පුව යටතේ සමාගම පහත අවස්ථා සඳහා වගකීමක් දරනු නොලැබේ.

1) ශ්‍රී ලංකාවේ ගොඩබිම් සීමාවෙන් පිටතදී ඇතිවූ ඕනෑම අනතුරක් අහිමිවීමක් හානියක් සහ/හෝ දැරීමට සිදුවූ හෝ පැනවුණු වන්දි වගකීම්.

2) කොන්ත්‍රාත් ගිවිසුමේ වගකීම් වලට පිටස්තරව පැන නැගෙන ඕනෑම හිමිකම් ඉල්ලීමක්.

3) මෙම ඔප්පුව යටතේ රක්ෂණාවරණය පිරිනමා ඇති වාහනය,

a. වත්මන් මෝටර් රක්ෂණාවරණය මගින් අනුමත නොකරන කාර්යයක් සඳහා යොදවා ගැනීමේදී හෝ

b. වත්මන් රක්ෂණ සහතිකය යටතේ අවසර නොලද පුද්ගලයකු විසින් පදවන ලද හෝ වෙනත් පුද්ගලයකුගේ භාරකාරීත්වය යටතේ පැදවීමට සිදුවූ අවස්ථාවන්හිදී සිදුවන අනතුරු අහිමිවීම් හානි හෝ දැරීමට සිදුවූ හෝ පැනවුණු වගකීම්.

4) පහත සඳහන් අවස්ථාවන් සෘජුව හෝ වක්‍රව, සමීපස්ථව හෝ දුරස්ථව හේතුවීමෙන්, දායකත්වයෙන්, ඒ තුලින් පැන නැගුනු හෝ ඊට සම්බන්ධව ඇතිවන ඕනෑම අනතුරක්, අහිමිවීමක්, හානියක් සහ/හෝ නීතිමය වගකීමක්, (නීතිමය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අවශ්‍ය අවස්ථාවන් හැර)

a. යුද්ධයක්,විදේශීය සතුරු ක්‍රියාවක්, ආක්‍රමණයක්, යුධ මෙහෙයුමක් වැනි එදිරිවාදිකමක් (යුද්ධයක් ප්‍රකාශයට පත් කිරීමට පෙර හෝ ඉන්පසු) සිවිල් යුද්ධයක්, කැරැල්ලක්, විප්ලවයක්, ආක්‍රමණයක්, හමුදා හෝ මහජන නැගී සිටීමක්.

b. වර්ජන, කැරලි කෝලාහල, මහජන කැළඹිලි.

c. රඳවාගැනීම, අත්පත් කරගැනීම, තහනම් කිරීම හෝ ඕනෑම තර්ජන උත්සාහයක්.

d. ජලගැලීම්, සුළිසුළං, මාරුත, ටොනේඩෝ, සුළි කුණාටු, කුණාටු, චණ්ඩ මාරුත, ගිණි කඳු පිපිරීම, භූමිකම්පා, හෝ ස්වාභාව ධර්මයේ

විපරීතභාවය හෝ වායුගෝලීය කැළඹීම්වල ප්‍රතිඵලයක් නිසා ඇතිවන තත්වයන්.

වන්දි හිමිකම් අපේක්ෂිත පුද්ගලයා ඕනෑම හිමිකම් අයදුමකදී එම අනතුර, අහිමිවීම, හානිය හෝ නීතිමය වගකීම ස්වාධීනව ඉහත අවස්ථාවන්ට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවූ බව තහවුරු කල යුතුය. එසේ කිරීමට අපොහොසත් වන වන්දි ඉල්ලීම් සඳහා සමාගම කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

5) මත්වීමට හේතුවන ඕනෑම මත්පැන් වර්ගයක් හෝ මත්ද්‍රව්‍යයක් භාවිතා කොට, රක්ෂිතයා විසින් හෝ ඔහුගේ අනුමැතිය මත එලෙස මත්පැන් හෝ මත්ද්‍රව්‍යයක් භාවිතා කල වෙනත් පුද්ගලයකු විසින් වාහනය පදවන විට ඍජුව හෝ වක්‍රාකාරව සිදුවන අනතුරක්, අහිමිවීමක් හෝ හානියක්.

6) (a)ඕනෑම ආනුෂංගික හානියක් මඟින් හෝ ඒ තුලින් පැන නගින හෝ එහි කවරාකාරයේ ප්‍රතිඵලයක් හේතුවෙන් ඇතිවන අනතුරක්, අහිමිවීමක්, දේපළ හානියක් හෝ වියදමක්.

(b)න්‍යෂ්ටික අපද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමෙන් ඇතිවන විකිරණ අපාවනයන් හෝ එමඟින් ඇතිවූ අයනීකරණ විකිරණ ඍජුව හෝ වක්‍රාකාරයෙන් බලපෑම නිසා පැනනගින ඕනෑම නීතිමය වගකීමක්. ඕනෑම ස්වයංපාලිත න්‍යෂ්ටික පිපිරීමක්ද ඊට ඇතුලත්ය.

**කොන්දේසි**

1)මෙම ඔප්පුව, ලේඛනය සහ වත්මන් මෝටර් රක්ෂණ සහතිකය එක් කොන්ත්‍රාත්තුවක් ලෙස කියවිය යුතු අතර ඒවායේ ඕනෑම කොටසකට සම්බන්ධ ඕනෑම වදනක් හෝ ප්‍රකාශනයක් එම විශේෂිත අරුතින්ම කියවිය යුතු වේ.

2)a)මෙම ඔප්පුව යටතේ රක්ෂිත මෝටර් වාහනයක් අනතුරකට අහිමිවීමකට හෝ හානියකට මුහුණ දුන් වහාම නිසි හඳුනාගැනීමේ සලකුණු සහිතව සමාගමේ නිකුත් කිරීමේ කාර්යාලයට ලිඛිතව දැනුම් දිය යුතුය. හිමිකම් අයදුමකදී සෑම ලිපියක්ම, ආඥාපත්‍රය, සිතාසි සහ / හෝ නීතිමය පියවර ලද වහාම රක්ෂිතයා විසින් සමාගමට ඉදිරිපත් කල යුතුය. මෙම ඔප්පුව යටතේ හිමිකම් අයදුමක් පැනනැගිය හැකි ඕනෑම සිද්ධියකට අදාළව අධිකරණයට ඉදිරිපත් විය හැකි චෝදනා පිළිබඳ දැනගත් වහාම සමාගම වෙත ලිඛිතව දැනුම් දිය යුතුය. මෙම ඔප්පුව යටතේ හිමිකම් වලට අදාළ විය හැකි සොරකම් හෝ වෙනත් අපරාධ ක්‍රියා සම්බන්ධයෙන් වහා පොලිසිය වෙත දැනුම් දිය යුතු අතර වරදකරුට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග වලදී සමාගමට සහය දැක්විය යුතුය.

b) මෙහිදී හානියට පත් වාහනයේ නිසි හඳුනාගැනීමේ සලකුණු ලෙස එහි ලියාපදිංචි අංකය සහ / හෝ චැසි අංකය සැපයිය යුතුය.

3 a) සමාගමේ ලිඛිත එකඟතාවක් නොමැතිව රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් මුදලක් පිළිගැනීම, පොරොන්දුවීම, ගෙවීම හෝ වන්දියක් ලබාදීම සිදු නොකළ යුතුය.එසේ එකඟතාව ලබන්නක් රක්ෂිතයාගේ සුභ සිද්ධිය වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග උදෙසා අත්‍යවශ්‍ය වූයේ නම් ඒ සඳහා හිමිකම් පිරිනැමිය හැකිවේ. හානි හෝ වෙනත් හේතූන් මත සිදුකෙරෙන ඕනෑම හිමිකම් ඉල්ලීමක් නීතිමය ක්‍රියාවලියක පූර්ණ අභිමතය අනුව හෝ හිමිකම් ඉල්ලීමක් සමථයකට පත් කිරීමට විය යුතු අතර, එම සියළු තොරතුරු සහ සමාගමට අවශ්‍ය වන සහාය රක්ෂිතයා විසින් ලබාදිය යුතුය.

(b) මෙම ඔප්පුවේ 2(8)කොටසේ 1(b) උපකොටස යටතේ යතුරුපැදියක් හෝ 2 (c) කොටසේ 1(b) උපකොටස යටතේ පුද්ගලික මෝටර් රථයක් හෝ යතුරු පැදියක් නොවන මෝටර් වාහනයක හිමිකම් අයදුමක් පැනනගින ඕනෑම අවස්ථාවක පූර්ණ රක්ෂණ මුදල රක්ෂිතයාට ගෙවා නීතිමය සහ සමථ ක්‍රියාමාර්ග වලට මැදිහත් වීමෙන් ඉවත්වීමට සමාගමට හැකියාවක් ඇත. එලෙස නීතිමය කරුණු දැක්වීමෙන් සමාගම ඉවත් වීම නිසා රක්ෂිතයාට

සිදුවිය හැකි හානියකට සමාගම වගකියනු නොලැබේ. සමාගම විසින් එම ක්‍රියාමාර්ග අත්හැරීමෙන් පසු රක්ෂිතයාට දැරීමට සිදුවන කුමන ආකාරයක හෝ වැය සහ වියදම් සඳහා මෙන්ම, වෙනත් පුද්ගලයකුගේ හිමිකම් ඉල්ලීම් සඳහා සමාගම නීතිමය වගකීමක් නොදරයි (පුද්ගලික මෝටර් රථ සඳහා අදාළ නොවේ.)

4)ලේඛනයේ / වල සඳහන් වාහනය හෝ එහි උපාංග හෝ අමතර කොටස් අළුත්වැඩියාකිරිම, යථා තත්වයට පත් කිරීම, නැවත යෙදවීම, අහිමිවීම හෝ හානිය මුදලින් ගෙවීම යන විකල්ප සමාගම සතුවේ. එහිදී සමාගමේ වගකීම අහිමිවූ හෝ හානියට පත්වූ කොටස්වල සැබෑ වටිනාකම සහ සවිකිරීමට වැයවූ සාධාරණ මුදලක් නොඉක්මවිය යුතුය. කිසිදු අවස්ථාවකදී එවැනි වාහනයක (ලේඛනයේ සඳහන් උපාංග සහ අමතර කොටස් ඇතුළුව)රක්ෂිතයාගේ ඇස්තමේන්තු වටිනාකම (Est. Value) හෝ අනතුරට පත් වන අවස්ථාවේ වාහනයේ වටිනාකම (උපාංග සහ අමතර කොටස් ඇතුළුව) යන දෙකින් අවමය ඉක්මවිය නොහැක. වාහනයට සහ / හෝ එහි අමතර කොටස් වලට අහිමිවීමක් / හානියක් සිදුවූ අවස්ථාවේ එහි කොටසක් ශ්‍රිලංකාවෙන් ලබාගත නොහැකිනම් හෝ හානිය මුදලින් ගෙවීමේ විකල්පය සමාගම විසින් යොදාගන්නේ නම්, එවැනි අවස්ථාවක සමාගමේ වගකීම පහත සීමාවන්ට යටත් වේ.

a (i) නිෂ්පාදකයා හෝ එහි ශ්‍රිලංකාවේ නියෝජිතයන් විසින් නිකුත් කරන ලද නවතම මිල ගණන් නාමාවලියේ දැක්වෙන මිල ගණන් හෝ

(ii) එවැනි මිල ගණන් නාමාවලියක් හෝ මිල දර්ශනයක් නොමැතිනම්, නිෂ්පාදකයා වෙතින් අවසන් වරට එසේ ලබාගත් මිල සහ වෙනත් විකල්පයක් නොමැති නම් ගුවනින් ඒවා ශ්‍රිලංකාවට ප්‍රවාහනය කිරීමේ සාධාරණ වියදමක් මෙන්ම අදාළ ආයතන බදු සහ එවැනි කොටසක් සවිකිරීම සඳහා වැයවන සාධාරණ මුදලකට සීමාවේ.

b) එවැනි කොටස් නැවත සවිකිරීමේ සාධාරණ ගාස්තුවක්.

5)ලේඛනයේ /වල සඳහන් වාහනය අලාභහානි වලින් ආරක්ෂා කරගැනීම සඳහා මෙන්ම වාහනය මාර්ගයට සුදුසු සහ කාර්යක්ෂම තත්වයෙන් පවත්වා ගැනීමට රක්ෂිතයා විසින් සියළු සාධාරණ පියවර ගත යුතු අතර වාහනය එහි කොටසක් හෝ රක්ෂිතයා විසින් යොදවන ලද රියදුරෙකු හෝ සේවකයකු පරික්ෂාව සඳහා සමාගමට සෑම අවස්ථාවකම ප්‍රවේශය සැලසිය යුතුය. මෝටර් රථය අනතුරකට හෝ බිඳ වැටීමකට ලක්වූ අවස්ථාවක රැකවරණයකින් තොරව හැර නොයා යුතු අතර ඊට තවදුරටත් අලාභ හානි සිදුවීම වැළැක්වීමට කටයුතු කළ යුතුය. එමෙන්ම එසේ අනතුරට පත් වාහනයක් අළුත්වැඩියාව සඳහා රැගෙන යාමේදී වාහනයට තවදුරටත් සිදුවිය හැකි අලාභ හානි සඳහා රක්ෂිතයා විසින් අවදානම දරාගත යුතුය.

6)දින හතක කාලසීමාවක් ලබාදී රක්ෂණ ගිවිසුම අවලංගු කිරීමට සමාගමට හැකියාවක් පවතී. එහිදී අදාළ ලිපිය රක්ෂිතයාගේ අවසන් වරට භාවිත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ. එහිදී රක්ෂණාවරණය බල පැවැත්වූ කාලසීමාව හැර ඉතිරි වාරික මුදල රක්ෂිතයා වෙත ලබාදෙනු ඇත. රක්ෂිතයා විසින්ද දින හතක කාලසීමාවක් ලබාදී රක්ෂණ ඔප්පුව අවලංගු කළ හැක.(වර්තමාන රක්ෂණාවරණ සමයේ හිමිකම් ඉල්ලීම් මතු නොවූයේ නම්) එහිදී රක්ෂණය බලපැවැත්වූ කාලසීමාව හැර ඉතිරි කාලය සඳහා සමාගමේ කෙටිකාලීන අනුපාත වලට අනුව වාරික මුදල් රක්ෂිතයාට ලබාගත හැකිවේ.

**7 (A)යතුරුපැදි හැර පුද්ගලික මෝටර් රථ සහ මෝටර් වාහන සඳහා බල පැවැත්වේ.**

**මෙම** රක්ෂණාවරණය යටතේ හිමිකම් අයදුම් කල අවස්ථාවක එම අලාභ හානි සඳහා වෙනත් රක්ෂණාවරණයක්ද පවතීනම්, අදාළ අලාභ හානි වන්දි හෝ වියදම් සඳහා සමාගමේ තක්සේරු

ගාස්තුව ඉක්මවන මුදලක් ගෙවීමට සමාගම බැඳී නොසිටී. මෙම කොන්දේසිය යටතේ සමාගමට කිසිදු වගකීමක් පැනවිය නොහැකි අතර, මෙම ඔප්පුවේ 2 (A) කොටසේ 3 (a) උප කොටස යටතේ **පුද්ගලික මෝටර් රථ සඳහාත්,** 2 (C) කොටසේ 3 (a) උප කොටස යටතේ **මෝටර් රථ හෝ යතුරුපැදි හැර අනිකුත් මෝටර් වාහන සඳහාත්, එය මුදාහැරීමට හැකිවනු ඇත.**

**(B) යතුරුපැදි සඳහා බල පැවැත්වේ.**

මෙම රක්ෂණාවරණය යටතේ හිමිකම් අයදුම් කල අවස්ථාවක එම අලාභ හානි සඳහා වෙනත් රක්ෂණාවරණයක්ද පවතීනම්, අදාළ අලාභ හානි වන්දි හෝ වියදම් සඳහා සමාගමේ තක්සේරු ගාස්තුව ඉක්මවන මුදලක් ගෙවීමට සමාගම බැඳී නොසිටී. මෙම කොන්දේසිය යටතේ සමාගමට කිසිදු වගකීමක් පැනවිය නොහැකි අතර, මෙම ඔප්පුවේ 2 (B) කොටසේ 3 (a) උප කොටස යටතේ පමණක් **යතුරුපැදි සඳහා එය මුදාහැරීමට හැකිවේ.**

**8) බේරුම්කරණය**

මෙම ඔප්පුව යටතේ යම් විෂමතාවක් මතුවුවහොත් එය බේරුම්කරුවෙකුගේ විනිශ්වය සඳහා යොමුකළ යුතුය.

i. විෂමතාවට බඳුන් වූ පාර්ශ්වයන් විසින් බේරුම්කරු ලිඛිතව පත් කර ගත යුතුය. එක් බේරුම්කරුවෙකු යටතේ විනිශ්වයක් ලැබීමට දෙපාර්ශ්වය අතර එකඟත්වය පල නොවන්නේ නම්, අපක්ෂපාති පුද්ගලයන් දෙදෙනෙකු බේරුම්කරුවන් ලෙස පත්කර ගත යුතු වේ. එක් පාර්ශ්වයකින් යොමුකළ ලිඛිත දැනුම්දීමකින් ලිත් මසක් ඇතුළත අනෙක් පාර්ශ්වයේ බේරුම්කරු නම් කල යුතුය. සිය බේරුම්කරු නම් කරන ලෙස දැනුම්දී, එසේ කිරීමට අපොහොසත් වූ විට හෝ එය ප්‍රතික්ෂේප කලවිට අනෙක් පාර්ශ්වයට සිය අභිමතය අනුව තම බේරුම්කරු වෙත විනිශ්වය භාර කල හැක.

ii. බේරුම්කරුවන් පිළිබඳ ගැටළුවකදී එම විෂමතාව දෙපාර්ශ්වය විසින් ලිඛිතව පත් කරගනු ලබන විනිශ්වයකරුවෙකු වෙත යොමුකළ යුතුය. විනිශ්වයකරුට තමා යටතේ, බේරුම්කරුවන් සමඟ බේරුම්කරණ රැස්වීම පවත්වා ගෙන යාහැකි අතර, එහිදී සිදුකරන පිරිනැමීමක් හිමිකම් උදෙසා සමාගමට එරෙහි ඕනෑම ක්‍රියාමාර්ගයකදී කොන්දේසි සහිත පූර්වාදර්ශයකි.

iii. මෙම ඔප්පුව යටතේ රක්ෂිතයාගේ ඕනෑම හිමිකම් අයදුමක් සඳහා නීතිමය වගකීම සමාගම විසින් ප්‍රතික්ෂේප කල විට, එදින සිට ලිත් මාස දොළහක් ඇතුළත බේරුම්කරුවෙකු වෙත යොමුකළ යුතු අතර, ඉන් පසුව එය අතහැර දැමුවාසේ සැලකේ.ඔප්පුවේ ප්‍රතිපාදන වලට අනුව නැවත අයකරගත නොහැක.

iv. බේරුම්කරණය කොළඹදී සිදු කල යුතුය.

9) මෙම ඔප්පුවේ නියමයන්, වගන්ති හා කොන්දේසි, එමඟින් සිදුකෙරෙන කාර්යයන් සඳහා මෙන්ම, රක්ෂිතයා වෙනුවෙන් ක්‍රියා කිරීමට අදාළ හෙයින් ඒවා නිසිලෙස පිළිපැදීම හා සපුරාලීම අත්‍යවශ්‍ය වෙයි. රක්ෂණාවරණ යෝජනාවේ ප්‍රකාශයන් සහ රක්ෂිතයා විසින් සිදු කරන ලද අනිකුත් සියළු ප්‍රකාශයන් සත්‍ය විය යුතු අතර එය මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් සිදුකිරීමට පූර්වාදර්ශ කොන්දේසියක් වනු ඇත.

10)වන්දි පිරිනැමීමෙන් පසුවද අවශ්‍ය විය හැකි, මෙම ඔප්පුව යටතේ සිදුවන අහිමිවීමකට හෝ හානියකට අදාළව

සමාගමට නීතිමය වගකීමක් පැවරීමේ අවස්ථා පවතින, තුන්වන පාර්ශ්වයන් වෙතින් වන්දි සහනයක් ලබාගැනීම හෝ ඒ සඳහා අයිතීන් සහ ක්‍රියාමාර්ග යෙදවීම සඳහා අවශ්‍ය වන සමාගමේ වියදමින් ගනු ලබන සාධාරණ පියවර සඳහා රක්ෂිතයා විසින් ඉඩ සැලසිය යුතු අතර පූර්ණ සහය ලබාදිය යුතුය.

11) රක්ෂිතයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාකරන අයෙකු මෙම ඔප්පුව යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා වංචා සහගත ලෙස හිමිකම් අයදුම් කලහොත්, නැතිනම් ඒ සඳහා ව්‍යාජ වංචා සහගත තොරතුරු, ද්‍රව්‍ය හෝ ලේඛන යොදාගන්නේ නම්, හෝ රක්ෂිතයාගේ අනුදැනුම සහිතව හෝ සිතා මතා අලාභ හානියක් සිදුකලේ නම්, හෝ ඊට සහය ලෙස ව්‍යාජ ප්‍රකාශනයක් සිදුකරන්නේ නම් හෝ ඉදිරිපත් කලේ නම් මෙම ඔප්පුව යටතේ ලබාදෙන සියළු වරප්‍රසාද අත්හිටවනු ලැබේ.

12) **මධ්‍යක කොන්දේසිය.**

ඔප්පුව මඟින් ආවරණය සලසා ඇති රක්ෂණය කරන ලද වාහනය, අනතුරකින් හානියක් සිදුවන අවස්ථාවේ, ඒවායේ වෙළඳපොළ වටිනාකම රක්ෂණයේදී ප්‍රකාශ කරන ලද වටිනාකමට වඩා වැඩිනම් රක්ෂිතයා විසින් එම වෙනසින් තක්සේරු කල ප්‍රතිශතයක් දැරිය යුතුය. වාහන සංඛ්‍යාව එකට වඩා වැඩිනම්, ඒවා වෙන් වෙන්ව මෙම තත්වයට මුහුණ දිය යුතු වේ. වාහනයේ වෙළඳපොළ වටිනාකම යනු ඊට සමාන තත්වයේ පවතින එම මාදිලියේ නිෂ්පාදනයක වටිනාකම බව අවබෝධයෙන් එකඟ වී ඇති බවද කිව යුතුය.

13) **වාරිකය ගෙවීමේ වගකීම.**

1. මෙම ඔප්පුවේ 2 වන සහ 3වන වගන්තිවලට අනුව එකඟවී ප්‍රකාශයට පත් කර ඇති පරිදි රක්ෂණයට අදාළ සම්පූර්ණ වාරික මුදල් ලේඛනයේ සඳහන් නියමිත දිනට පෙර සමාගම වෙත ගෙවිය යුතුය. මෙම ඔප්පුවේ දීර්ඝ කිරීමේ සහතිකයේ සහ තහවුරු කිරීමේ ආවරණ ලිපියේ සඳහන් (රක්ෂණාවරණයේ ආරම්භයේ පටන් දින 60ක් ඇතුළත) එම දිනට හෝ ඊට පෙර මෙම ගෙවීම් සිදුකල යුතුවේ. එම වාරික මුදල නියමිත දිනට නොලැබුනහොත් රක්ෂණය ආරම්භකර දින 60ක් ගතවීමට පෙර රක්ෂිතයා විසින් වාරික මුදල් සියල්ල ගෙවීම අවශ්‍යතාවයකි. රක්ෂණාවරණයේ ආරම්භය,දීර්ඝ කිරීම,හෝ තහවුරු කිරීමේ තාවකාලික ආවරණ සහතිකය නිකුත් කිරීමේ දින සිට දින 60 කින් එළඹෙන එම දිනය (මින් ඉදිරියට නියමිත දිනය “ due date” ලෙස හඳුන්වනු ලබන ) නියමිත දිනය ලෙස හඳුන්වනුලබේ. මෙම සහතිකයේ අවශ්‍යතාව උදෙසා නියමිත දිනය රක්ෂණාවරණයේ ආරම්භක දිනය හෝ ආවරණය ලැබුන දිනය සේ සැලකේ.

2. එමෙන්ම මුළු වාරිකය නියමිත දිනට හෝ ඊට පෙර ගෙවීම මෙම ඔප්පුව යටතේ සමාගමේ වගකීම් හෝ හිමිකම් ලබාදීම, දීර්ඝ කිරීමේ හෝ ආවරණය තහවුරු කිරීමේ සටහන සඳහා පූර්ව කොන්දේසියකි. හිමිකම් අයදුම ආරම්භක දිනය සහ රක්ෂණයේ නියමිත දිනය අතර එලඹුන අවස්ථාවක සමාගම මඟින් වගකීම පිළිබඳ තීරණ ගැනීම කල් තැබීම හෝ වන්දි ගෙවීම කල් දැමීම වැනි තීරණයකට එලඹිය හැක. එහිදී එවන් හිමිකමක් මුළු වාරිකය නියමිත දිනට හෝ ඊට පෙර ගෙවීමෙන් අනතුරුව ලබාදෙනු ඇත.

මෙහිදී තවදුරටත් ප්‍රකාශකොට එකඟවී ඇති පරිදි නියමිත දිනයේදී රක්ෂකයාගේ ව්‍යාපාර කටයුතු වසා ඇත්නම් මෙම රක්ෂණය යටතේ පවතින වගකීම් අවලංගුකොට අත්හිටවා ඉවත්කරනු ලැබේ. එහෙත් එවැනි අවලංගු කිරීමකදී රක්ෂණය ගෙවී ගිය කාලය සඳහා රක්ෂිතයා විසින් ගෙවිය යුතුව

තිබූ මුළු වාරික මුදල අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයකට එළඹීමට සමාගමට පවතින අයිතිය අගතියෙන් තොර වේ.

මෙහිදී අවබෝධයෙන් එකඟවී ඇති පරිදි පහත දැක්වෙන වගන්ති ඔප්පු ලේඛනයේ සඳහන් කොට ඇත්නම්, එම වගන්ති මෙම ඔප්පුවට නිත්‍යානුකූලව සංයුක්ත කොට තිබේ. විශේෂයෙන් වෙනස්වන අවස්ථාවක හැර මෙම ඔප්පුවේ සියළු වගන්ති කොන්දේසි සහ බැහැර කිරීම් බලපැවැත්වේ.

**1වන වගන්තිය - තුන්වන පාර්ශ්වයන් සඳහා පමණයි**

මෙහිදී අවබෝධයෙන් එකඟවී ඇති පරිදි,මෙම ඔප්පුවේ පළවන(1) වන කොටස (සහ එහි බැහැර කිරීම්) සහ තුන්වන කොටස(3) අවලංගු කෙරේ.

තවදුරටත් අවබෝධාත්මකව එකඟවී ඇති පරිදි ඔප්පුවේ පස්වන (5)කොන්දේසියේ මුද්‍රිත වචන පෙළද අවලංගු වන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන කොන්දේසිය ඇතුලත් කරනු ලැබේ.

"5වන කොන්දේසිය; මෝටර් වාහනය කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගැනීම සඳහා රක්ෂිතයා විසින් සියළු සාධාරණ පියවර ගත යුතු අතර, වාහනය හෝ එහි ඕනෑම කොටසක් හෝ රියදුරු / පදවන්නා හෝ සේවකයෙකු පරික්ෂා කිරීමට සියළු අවස්ථාවන්හිදී සමාගමට පූර්ණ ප්‍රවේශයක් හිමිවේ."

**2 වන වගන්තිය - තුන්වන පාර්ශ්වයේ ගිණි සහ සොරකම්**

මෙහිදී අවබෝධයෙන් එකඟවී ඇති පරිදි මෙම ඔප්පුවේ පළවන(1) වන කොටසේ අඩංගු කිසිවකට පරස්පර නොවන පරිදි ගිණි, බාහිර පිපිරීම්, ඉබේ ගිණිගැනීම්, අකුණුසැර, සොරකම්, නිවාස බිඳීම්, පැහැරගැනීම් වලට අදාළ අහිමිවීමක් හෝ හානියක් හැර මේ යටතේ නීතිමය වගකීම් නොදරයි. තවදුරටත් අවබෝධයෙන් එකඟවී ඇති පරිදි ඔප්පුවේ තුන්වන (3) කොටස අවලංගු වන බවට සැලකේ.

**3 වන වගන්තිය - ජලගැලීම් සහ ස්වාභාවික ආපදා**

මෙම ඔප්පුවේ 4 වන සාමාන්‍ය බැහැර කිරීම් ((d)කොටස)යටතේ අඩංගු කිසිවකට පරස්පර නොවන පරිදි අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන, මෙමඟින් එකඟවී ප්‍රකාශයට පත්කර ඇති පරිදි ජලගැලීම්, සුළි සුළං, චණ්ඩ මාරුත, කුණාටු, ටොනේඩෝ, උදම්රළ, හිම කුණාටු හෝ වෙනත් වායුගෝලීය කැළඹීම්, ගිනිකඳු පිපිරීම්, භූමි කම්පා, නායයාම්, පස්කඳු කඩාවැටීම්,හෝ ඔප්පුවෙන් ආවරණය කර ඇති වෙනත් ස්වභාවික කම්පනයක් ඍජුව, වක්‍රාකාරව, සමීපව හෝ දුරස්ථව ඒ නිසා හෝ එමඟින් පැන නැඟුනු ඕනෑම අනතුරක්, අහිමිවීමක් හෝ හානියක් සහ / හෝ නීතිමය වගකීමක් මෙම ඔප්පුව යටතේ ආවරණය කෙරේ.

මෙම වගන්තියට අදාළව " ජලගැලීම්" යනු ජලාශයක්, ඇලක්, හෝ වේල්ලක් ඕනෑම ස්වභාවික හෝ කෘතිම ජල ප්‍රවාහයකින් ජලය පිටතට ගලා ඒම වේ.

**බැහැර කිරීම්** : ඉහත දක්වන ලද ආවරණය ලැබූ ආපදා හැර වෙනත් වායුගෝලීය කැළඹීම්, ස්වභාවික කම්පන, නායයැම් හෝ සමුද්‍රබාදන ආදිය නිසා මුහුදු ජලයෙන් යටවීම.

**4 වන වගන්තිය - වැඩ වර්ජන කැරළි කෝලාහල සහ මහජන කැළඹීම්.**

මෙම ඔප්පුවේ පොදු බැහැර කිරීම් 4 යටතේ "වර්ජන කෝලාහල සහ මහජන කැළඹීම්" යන සඳහන් කොට ඇති වදන් පහත දැක්වෙන අවස්ථාවන් හේතුවෙන් සිදුවන අනතුරක්, අලාභයක්, හානියක් හෝ හිමිකමක් සඳහා බල නොපැවැත්වේ.

1 ඕනෑම පුද්ගලයකු තවත් අය හා එක්ව මහජන සාමයට බාධා වන අයුරින් සිදුකරන ඕනෑම ක්‍රියාවක් (වර්ජනයක් අවහිර කිරීමක් හෝ ඊට සම්බන්ධ හෝ නොමැති)

2 එවැනි බාධාකිරීමක් මර්ධනය කිරීමට,ඒ සඳහා උත්සාහ කිරීමට,හෝ එවැනි බාධාවක හානිය අවම කිරීමට නිත්‍යානුකූල අධිකාරිය මඟින් ගනු ලබන පියවර.

3 වර්ජකයෙකු හෝ සේවාස්ථානය අවහිර කල සේවකයෙකු එම වර්ජනය හෝ බාධාව වැඩිදියුණු කිරීමට සිතාමතා සිදුකරන ඕනෑම ක්‍රියාවක්.

4 එවැනි තත්වයක් වැළැක්වීම සඳහා හෝ බලපෑම් අවම කරලීම සඳහා නිත්‍යානුකූල ව්‍යස්ථාපිත ආයතන/ බලධරයකු මඟින් ගනු ලබන පියවර.

පහත නම් කර ඇති ඕනෑම සිදුවීමක් නිසා එමගින් හෝ සෘජු හෝ වක්‍රාකාර බලපෑමක් මත සිදුවන ඕනෑම අනතුරක්, අහිමිවීමක් හානියක් හෝ වගකීමක්(වස්ථාදායකයේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අවශ්‍ය පියවරහැර ) මෙම රක්ෂණය මඟින් ආවරණය කරනු නොලබයි.

(a)යුද්ධ, ආක්‍රමණ, විදේශ සතුරු ක්‍රියාමාර්ග, එදිරිවාදිකම්, හෝ යුද්ධයක් වැනි මෙහෙයුම් (සිවිල් යුද්ධයක් ප්‍රකාශයට පත් කර හෝ නොමැතිව).

(b)හමුදා කැරැල්ලක් හෝ මහජන නැඟී සිටීමකට සම්බන්ධ මහජන කැලඹිලි, හමුදා නැඟි සිටීම්, විප්ලව, කෝලාහල, හමුදා හෝ වෙනත් බලවේග, යුධ නීතිය හෝ වැටලීම් තත්වයක් ප්‍රකාශයට පත්කොට පවත්වාගෙන යාමට හේතුවන ඕනෑම සිදුවීමක්.

(c)ත්‍රස්තවාදී ක්‍රියා ලෙස හඳුන්වනු ලබන බලය යෙදවීම හෝ ප්‍රචණ්ඩත්වය හෝ/සහ එහි තර්ජනයන්ට සීමා නොවූ යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් තනිව ක්‍රියාකරමින් හෝ දේශපාලනික, ආගමික, මූලධර්මවාදී හෝ වාර්ගික අරමුණු සහ හේතූන් උදෙසා කැපවූ යම් සංවිධානයක් (සංවිධාන) හෝ රජය (රජයන්) හා එක්ව හෝ ඔවුන් වෙනුවෙන්, යම් රජයකට බලපෑම් කිරීම සහ/හෝ මහජනතාව හෝ යම් ජන කොටසක් බියගැන්වීමට සිදුකෙරෙන ක්‍රියා ඇතුළු ඕනෑම ක්‍රියාවක්.රජයේ ආරක්ෂක හමුදා සහ ගොඩබිම මුහුද හෝ ගුවන කේන්ද්‍ර කරගත් යම් කණ්ඩායමක් අතර ඕනෑම ගැටුම් තත්වයකදී පාලනය,වැළැක්වීම සහ මර්ධනය උදෙසා ගනු ලබන ඕනෑම පියවරක සෘජු හෝ වක්‍ර බලපෑමක් ලෙස සිදුවන ඕනෑම අහිමිවීමක්, හෝ හානියක්, වියදමක් හෝ කවර ආකාරයේ වැයක්, ත්‍රස්තවාදය යටතේ අර්ථ දැක්වේ. මෙම කොන්දේසියේ ප්‍රතිපාදන මත යම් අහිමිවීමක් හෝ හානියක් මෙම රක්ෂණයමඟින්ආවරණය නොවීමට එරෙහි ඕනෑම නීතිමය හෝ වෙනත් ක්‍රියාමාර්ගයකින් එම අහිමිවීම, හෝ හානිය මෙම රක්ෂණය මඟින් ආවරණය වන බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයාට පැවරේ.

එවැනි තත්වයක් යටතේ ඕනෑම හිමිකම් අයදුම් කිරීමක් සඳහා එම අනතුර, අහිමිවීම, හානිය හෝ මතුවූ වගකීම ස්වාධීනව සහ කිසිදු ආකාරයකින් සම්බන්ධ හෝ අවස්ථානුකූලව හෝ දායකවීමෙන් ඡායාමාත්‍ර වශයෙන් හෝ ඉහත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස ඇති නොවූ බව රක්ෂිතයා විසින් තහවුරු කල යුතුය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, අදාළ හිමිකම් ඉල්ලීම් සඳහා කිසිදු ගෙවීමක් කිරීමට සමාගම බැඳී නොසිටි.

එසේම තවදුරටත් මෙම ඔප්පුවේ 6 (හයවන)කොන්දේසිය ලෙස සඳහන් වී ඇති පරිදි රක්ෂකයාට ඕනෑම විටෙක මෙම රක්ෂණය අවලංගු කල හැකි බවට ප්‍රකාශ කොට එකහත්වය පලවී තිබේ. රක්ෂිතයාගේ අවසන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකරන දැනුම් දීමක් මඟින් මෙලෙස රක්ෂණය අවසන් කල හැක. එවැනි අවස්ථාවක කල් ඉකුත් නොවූ කාලසීමාව සඳහා තක්සේරු කල වාරික මුදල් ප්‍රමාණයක් රක්ෂිතයා වෙත ලබාදීමට රක්ෂකයා බැඳී සිටි. එහෙත් රක්ෂිතයාගේ ඉල්ලීම මත

රක්ෂණය අවලංගු කලහොත් වාරික මුදල් කිසිවක් ආපසු ගෙවීමට සමාගම නීතිමය වශයෙන් බැඳී නොමැත. මෙහිදී එකඟවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම දිගුව පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත්වේ.

**A විකිරණශීලී ආපාවනය, රසායනික, ජෛව රසායනික, සහ විද්‍යුත් චුම්භක අවි ආයුධ බැහැර කිරීමේ වගන්තිය.**

මෙම වගන්තිය ප්‍රමුඛ වගන්තියක් වන අතර මෙම රක්ෂණයේ දක්වා ඇති මේ හා නොගැලපෙන යමක් ඇත්නම්, එය නොසලකා හැරේ.

1 කිසිදු අවස්ථාවක පහත සඳහන් කරුණු වලින් හටගන්නා, ඒ නිසා සිදුවූ හෝ ඊට දායකවූ අලාභයක් අහිමිවීමක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණ මඟින් ආවරණය නොවේ.

1.1 න්‍යෂ්ටික අපද්‍රව්‍ය හෝ ඕනෑම න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමකින් ඇතිවන විකිරණ ආපාවනයක් හෝ එමඟින් ඇතිවූ අයනීකරණ විකිරණ හෝ දූෂණය වීම.
1.2 ඕනෑම න්‍යෂ්ටික පිහිටුවීමක, ප්‍රතික්‍රියාකාරකයක හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ
1.3 පරමාණුක හෝ න්‍යාෂ්ටික විඛණ්ඩනය සහ /හෝ සංයෝජනය හෝ ඊට සමාන ප්‍රතික්‍රියා හෝ විකිරනශීලි බලයක් හෝ පදාර්ථ භාවිතා කරන ආයුධයක් හෝ උපකරණයක්
1.4 ඕනෑම විකිරණශීලි පදාර්ථයක උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ මෙම උප වගන්තියෙන් වන බැහැර කිරීම වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍යමය, විද්‍යාත්මක හෝ එවැනි සාමකාමී කාර්යයක් සඳහා න්‍යාෂ්ටික ඉන්ධන හැර විකිරණශීලි සමස්ථානික සකස් කිරීම රැගෙනයාම හා ගබඩා කිරීමට අදාළ නොවේ.
1.5 ඕනෑම , රසායනික, ජෛව රසායනික,හෝ විද්‍යුත් චුම්භක අවි ආයුධ

**B සයිබර් ආක්‍රමණ බැහැරකිරීමේ වගන්තිය**

1.1 පහත සඳහන් 1.2 වගන්තියට පමණක් යටත්ව යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංගයක්, ද්වේශ සහගතව සකසන ලද පරිගණක කේතයක්. පරිගණක වෛරසයක් හෝ ක්‍රියාවලියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හානිකාරක ක්‍රමවේදයක්ලෙස භාවිතයෙන් හටගන්නා ඊට දායකවූ හෝ ඒ හේතුවෙන් සිදුවූ කිසිදු අහිමිවීමක්, හානියක්, බැරකමක්,හෝ වියදමක් මෙම රක්ෂණාවරණයෙන් ආවරණය නොවේ.

1.2 යුද්ධ, සිවිල් යුද්ධ ,විප්ලව, කැරලි, අභිද්‍රෝහ, හෝ මහජන කැළඹීම්, හෝ වෙනත් රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් ත්‍රස්තවාදය හෝ දේශපාලනික අභිප්‍රායකින් ක්‍රියාත්මක වන පුද්ගලයකුගේ ක්‍රියා ආවරණය කරනු ලබන රක්ෂණාවරණයක මෙම වගන්තිය ඇතුලත් කොට ඇතිවිට 1.1 වගන්තියෙන් කරනු ලබන බැහැර කිරීමට (එසේ නැතිනම් අදාළවන) පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් යම් ආයුධයක හෝ මිසයිලයක දියත් කිරීම සහ / හෝ පාලනය සහ / හෝ වෙඩි තැබීමේ යාන්ත්‍රනය සඳහා භාවිත කිරීමකදී අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන් ලබාදෙන මෙම විශේෂිත දිගුව යටතේ පැනනැගෙන ඕනෑම නීතිමය වගකීමක් අදාළ අරමුදල වෙත පැවරේ. ඕනෑම අහිමිවීමක් හෝ හානියක් මෙම පිටසන මඟින් ආවරණය නොකෙරෙන විට එය මෙමඟින් ආවරණය කෙරෙන බවට පැවරෙන නඩුවක් පැමිණිල්ලක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයකදී එම

අභිමිවීම හෝ හානිය මෙමඟින් ආවරණය වන බවට ඔප්පු කිරීම රක්ෂිතයා විසින් සිදුකල යුතුය.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් සහ අත්හැරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

**5 වන වගන්තිය - ත්‍රස්තවාදී පිටසන - මෝටර්**

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙහිදී ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි ලිඛිත ඔප්පුව යටතේ ඇති වර්ජන, කළහ සහ සිවිල් කෝලාහල පිටසන /වගන්තිය / දිගුවට පරස්පර නොවන පරිදි පහත සඳහන් අවස්ථාවන් ඇතුලත් කිරීම සඳහා රක්ෂණය මෙයින් දිගු කෙරේ.

ත්‍රස්තවාදී ක්‍රියා ලෙස හඳුන්වනු ලබන බලය යෙදවීම හෝ ප්‍රචණ්ඩත්වය හෝ/සහ එහි තර්ජනයන්ට සීමා නොවූ යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් තනිව ක්‍රියාකරමින් හෝ දේශපාලනික, ආගමික, මූලධර්මවාදී හෝ වාර්ගික අරමුණු සහ හේතූන් උදෙසා කැපවූ යම් සංවිධානයක් (සංවිධාන) හෝ රජය (රජයන්) හා එක්ව හෝ ඔවුන් වෙනුවෙන්, යම් රජයකට බලපෑම් කිරීම සහ/හෝ මහජනතාව හෝ යම් ජන කොටසක් බියගැන්වීමට සිදුකෙරෙන ක්‍රියා ඇතුළු ඕනෑම ක්‍රියාවක්.

රජයේ ආරක්ෂක හමුදා සහ ගොඩබිම මුහුද හෝ ගුවන කේන්ද්‍ර කරගත් යම් කණ්ඩායමක් අතර ඕනෑම ගැටුම් තත්වයකදී පාලනය,වැළැක්වීම සහ මර්ධනය උදෙසා ගනු ලබන ඕනෑම පියවරක සෘජු හෝ වක්‍ර බලපෑමක් ලෙස සිදුවන ඕනෑම අභිමිවීමක්, අලාභයක් හෝ හානියක්, වියදමක් හෝ කවර ආකාරයේ වැයක්, ත්‍රස්තවාදය යටතේ අර්ථ දැක්වේ. මෙම කොන්දේසියේ ප්‍රතිපාදන මත යම් අභිමිවීමක් හෝ හානියක් මෙම රක්ෂණයමඟින්ආවරණය නොවීමට එරෙහි ඕනෑම නීතිමය හෝ වෙනත් ක්‍රියාමාර්ගයකින් එම අභිමිවීම, හෝ හානිය මෙම රක්ෂණය මඟින් ආවරණය වන බව ඔප්පු කිරීමේ වගකීම රක්ෂිතයාට පැවරේ.

එහිදී මෙම දිගුව මඟින් පහත දැක්වෙන අවස්ථාවන් ආවරණය නොකෙරේ.

(a)අතුරු ප්‍රතිඵලයක් ලෙස හෝ වක්‍රාකාරව කිසිදු සහ කවර ආකාරයකින් හෝ සිදුවන අභිමිවීමක්, හෝ හානියක්

(b) මුළුමනින්ම හෝ පාර්ශ්වික වශයෙන් සේවය නතර කිරීම, නැවත විකිණීම, බාධා හෝ ඕනෑම ක්‍රියාවලියක් හෝ මෙහෙයුමක් අත්හිටුවීම නිසා සිදුවන අභිමිවීම් සහ හානි.

(c)ඕනෑම නීත්‍යානුකූල ව්‍යවස්ථාපිත අධිකාරියක් මඟින් තාවකාලිකව හෝ ස්ථිරව පවරා ගැනීම නිසා සිදුවන අභිමිවීම් හෝ හානි.

ඕනෑම එක් සිද්ධියකදී හානියට පත් එක් වාහනයක් වෙනුවෙන් උපරිම වගකීම රු. ............හෝ රක්ෂිත මුදල හෝ යන දෙකින් අඩු අගය වේ.

ඔප්පුවේ සඳහන්ව ඇති නමුදු, ඒ සඳහා ලබාදී ඇති ත්‍රස්තවාදී ආවරණ දිගුව රක්ෂකයා විසින් අවලංගු කල හැකි අතර එහිදී තක්සේරු කළ මුදලක් රක්ෂිතයා වෙත නිකුත් කිරීමට අවසර ලැබේ. එහෙත් රක්ෂිතයාගේ ඉල්ලීම මත එම දිගුව අවලංගු කලහොත් වාරික මුදල් කිසිවක් ආපසු ගෙවනු නොලැබේ.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

මෙහිදී එකඟවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම දිගුව පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත්වේ.

**A විකිරණශීලී ආපාචනය, රසායනික, ජෛව රසායනික, සහ විද්‍යුත් චුම්භක ආයුධ බැහැර කිරීමේ වගන්තිය.**

මෙම වගන්තිය ප්‍රමුඛ වගන්තියක් වන අතර මෙම රක්ෂණයේ දක්වා ඇති මේ හා නොගැලපෙන යමක් ඇත්නම්, එය නොසලකා හැරේ.

1 කිසිදු අවස්ථාවක පහත සඳහන් කරුණු වලින් හටගන්නා, ඒ නිසා සිදුවූ හෝ ඊට දායකවූ අහිමිවීමක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණ මඟින් ආවරණය නොවේ.

1.6 න්‍යෂ්ටික අපද්‍රව්‍ය හෝ ඕනෑම න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමකින් ඇතිවන විකිරණ ආපාවනයක් හෝ එමඟින් ඇතිවූ අයනීකරණ විකිරණ.

1.7 ඕනෑම න්‍යෂ්ටික පිහිටුවීමක, ප්‍රතික්‍රියාකාරකයක හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ

1.8 පරමාණුක හෝ න්‍යෂ්ටික විඛණ්ඩනය සහ /හෝ සංයෝජනය හෝ ඊට සමාන ප්‍රතික්‍රියා හෝ විකිරනශීලි බලයක් හෝ පදාර්ථ භාවිතා කරන ආයුධයක් හෝ උපකරණයක්

1.9 ඕනෑම විකිරණශීලි පදාර්ථයක උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ මෙම උප වගන්තියෙන් වන බැහැර කිරීම වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍යමය, විද්‍යාත්මක හෝ එවැනි සාමකාමී කාර්යයක් සඳහා න්‍යාෂ්ටික ඉන්ධන හැර විකිරණශීලි සමස්ථානික සකස් කිරීම රැගෙනයාම හා ගබඩා කිරීමට අදාළ නොවේ.

1.10 ඕනෑම , රසායනික, ජෛව රසායනික,හෝ විද්‍යුත් චුම්භක ආයුධ

**B සයිබර් ආක්‍රමණ බැහැරකිරීමේ වගන්තිය**

1.1 පහත සඳහන් 1.2 වගන්තියට පමණක් යටත්ව යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංගයක්, ද්වේශ සහගතව සකසන ලද පරිගණක කේතයක්. පරිගණක වෛරසයක් හෝ ක්‍රියාවලියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හානිකාරක ක්‍රමවේදයක්ලෙස භාවිතයෙන් හටගන්නා ඊට දායකවූ හෝ ඒ හේතුවෙන් සිදුවූ කිසිදු අහිමිවීමක්, හානියක්, බැරකමක්,හෝ වියදමක් මෙම රක්ෂණාවරණයෙන් ආවරණය නොවේ.

1.2 යුද්ධ, සිවිල් යුද්ධ ,විප්ලව, කැරලි, අභිද්‍රෝහ, හෝ මහජන කැළඹීම්, හෝ වෙනත් රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් ත්‍රස්තවාදය හෝ දේශපාලනික අභිප්‍රායකින් ක්‍රියාත්මක වන පුද්ගලයකුගේ ක්‍රියා ආවරණය කරනු ලබන රක්ෂණාවරණයක මෙම වගන්තිය ඇතුලත් කොට ඇතිවිට 1.1 වගන්තියෙන් කරනු ලබන බැහැර කිරීමට (එසේ නැතිනම් අදාළවන) පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් යම් ආයුධයක හෝ මිසයිලයක දියත් කිරීම සහ / හෝ පාලනය සහ / හෝ වෙඩි තැබීමේ යාන්ත්‍රනය සඳහා භාවිත කිරීමකදී අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන් ලබාදෙන මෙම විශේෂිත දිගුව යටතේ පැනනැගෙන ඕනෑම නීතිමය වගකීමක් අදාළ අරමුදල වෙත පැවරේ. ඕනෑම අහිමිවීමක් හෝ හානියක් මෙම පිටසන මඟින් ආවරණය නොකෙරෙන විට එය මෙමඟින් ආවරණය කෙරෙන බවට පැවරෙන නඩුවක් පැමිණිල්ලක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයකදී එම අහිමිවීම හෝ හානිය මෙමඟින් ආවරණය වන බවට ඔප්පු කිරීම රක්ෂිතයා විසින් සිදුකල යුතුය.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් සහ අත්හැරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

## 6 වන වගන්තිය - සේවක වන්දි රක්ෂණය

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවූ බව සැලකිල්ලට ගෙන 1934 සේවක වන්දි විධි විධාන පනත සහ එහි සංශෝධන වලට අනුකූලව වන්දි පිරිනැමීමට සමාගම කටයුතු කරයි. මෙම වගන්තිය නිකුත් කිරීමට පෙර සම්මත විධි විධාන වලට අනුව ලේඛනයේ සඳහන් මුදල් ගෙවන රියදුරෙකු සහ / හෝ සහයකයකු ක්ලිනර්වරයෙකු හෝ කම්කරුවෙකු /කම්කරුවන් රක්ෂිතයා වෙනුවෙන් සේවය කරමින් සිටියදී පෞද්ගලික අනතුරු සඳහා ලිඛිත එකඟතාවකට අනුව අදාළ අමතර වැය සහ වියදම් සඳහා වගකීම දරනු ඇත.

රක්ෂිතයා විසින් සෑම රක්ෂණ වාරයකම කල් ඉකුත්වීම සහතික කල යුතු අතර එම කාලය තුළ ලේඛනයේ සඳහන් වාහනය / වාහනවල සේවයේ යොදවන රියදුරන් සහ / හෝ සහයකයන් සහ / හෝ ක්ලිනර්වරුන් සහ /හෝ කම්කරුවන් උපරිම සංඛ්‍යාවද දැනුම් දිය යුතුය. ඒ අනුව රක්ෂණාවරණය සඳහා වාරිකය සකස් කරනු ඇත.

i. යුද්ධ, ආක්‍රමණ, විදේශීය සතුරු ක්‍රියාමාර්ග, එදිරිවාදිකම්,යුද්ධයක් වැනි මෙහෙයුම්, (යුද්ධයක් ප්‍රකාශයට පත් කර හෝ නැතිව ) සිවිල් යුද්ධ, කැරළි,කෝලාහල, විප්ලව, කුමන්ත්‍රණ, හමුදා හෝ වෙනත් බලවේග වලට දූරස්ථව, සමීපව ඍජුව හෝ වක්‍රාකාරයෙන් ගොදුරු වූ වාහන සඳහා රක්ෂිතයා වෙත වන්දි ගෙවනු නොලැබේ.

ii. රක්ෂිතයා වෙනත් රක්ෂකයකු හෝ රක්ෂකයන් සමූහයක් වෙතින් බලපෑම් වලට ලක්ව සිටින හෝ හිමිකම් ගැටළු හේතුවෙන් රඳවාගෙන සිටින අවස්ථාවක සමාගම රක්ෂිතයා වෙත වන්දි නොගෙවයි. රක්ෂණ ඔප්පුවේ වගන්තිවලට අනුව මෙම රක්ෂණාවරණය සාමාන්‍ය සේවකයන් සඳහා රක්ෂණයක් ලෙස සලකනු ලැබේ.

iii. රක්ෂිතයා විසින් අනතුරු වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පියවර ගත යුතු අතර සියළු නීති ප්‍රකාර කටයුතු වලට එකඟත්වයෙන් කටයුතු කල යුතුය.

iv. රක්ෂිතයා විසින් එක් එක් රියදුරු සහයක ක්ලිනර් හෝ කම්කරුවන්ගේ නම්, වේතන සහ අනිකුත් ඉපයීම් පිළිබඳව සටහනක් තබාගත යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හිදී සමාගමට අදාළ සටහන් පරික්ෂාවට ඉඩ ලබාදිය යුතුය.

v. රක්ෂණ ඔප්පුවේ මෙම වගන්තිය යටතේ ගෙවන ලද හිමිකම් අයදුම් නොකිරීමේ ප්‍රසාද (‘NCB’ ) වගන්තිය හේතුවෙන් නැවත ගෙවීමට අදාළ නොවේ. මෙම වගන්තිය යටතේ සිදුකරන ලද ඕනෑම ගෙවීමක් ඔප්පුව අනුව **හිමිකම් අයදුම් නොකිරීමේ වගන්තිය යටතේ යලි ලබා ගැනීමට නොහැක.**

vi. **රක්ෂිතයාගේ ඉල්ලීම අනුව ඔප්පුව අවලංගු කල අවස්ථාවක** මෙම වගන්තිය යටතේ ගෙවන ලද, වාරික මුදල් නැවත ගෙවීමට ඉඩ ලබා නොදේ.

vii. බඩු පැටවීමේ සහ බෑමේ අපේක්ෂාවෙන් රක්ෂිතයාගේ වාහනයේ රැගෙන යන කම්කරුවන් මෙම ඔප්පුව යටතේ සහායකයන් ලෙස හැදින්විය නොහැක.

viii. එවැනි වන්දියක් ගෙවිය හැකි වන්නේ සේවකයා සහ ඔහුගේ යැපෙන්නන් පූර්ණ වශයෙන් තෘප්තිමත්ව රක්ෂිතයාට එරෙහිව

සියළු වගකීම් මුදාහැරීමට එකඟත්වය පළකිරීමෙන් පසුව පමණි. එවැනි එකඟත්වයක් ඇති නොවූ විටදී සමාගම විසින් සාමාන්‍ය නීතිය යටතේ රක්ෂිතයාගේ නීතිමය වගකීම් වලට එරෙහිව සහ ඔහුගේ ලිඛිත අවසරයෙන් වැය සහ වියදම් සඳහා වන්දි ගෙවීමක් සිදු කරයි. (පෞද්ගලික මෝටර් රථ සඳහා පමණි.)

**7 වන වගන්තිය - රියදුරු/ ක්ලිනර් / සහයක සේවක වන්දි රක්ෂණය සඳහා ත්‍රස්තවාදී ආවරණය.**

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන, මෙමඟින් එකඟවී ප්‍රකාශ කරන පරිදි, මෙම ඔප්පුවට සම්බන්ධ සේවක වන්දි රක්ෂණ පිටසනයේ (a) කොන්දේසියට පරස්පර නොවන පරිදි ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවකට ඍජු ලෙස සම්බන්ධ අහිමිවීමක් හෝ හානියක් ආවරණය කිරීම සඳහා මෙම ආවරණය දිගු කෙරේ.

ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවකින් හෝ එහි ඍජු බලපෑමෙන් ලේඛනයේ දක්වා ඇති සේවක කාණ්ඩවලට සිදුවන ශාරීරික තුවාලයක් හෝ මරණයේදී වන්දියක් ලබාදීමට එමඟින් ප්‍රතිපාදන සැලසේ. එහිදී ත්‍රස්තවාදී ක්‍රියා ලෙස හඳුන්වනු ලබන බලය යෙදවීම හෝ ප්‍රචණ්ඩත්වය හෝ/සහ එහි තර්ජනයන්ට සීමා නොවූ යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් තනිව ක්‍රියාකරමින් හෝ දේශපාලනික, ආගමික, මූලධර්මවාදී හෝ වාර්ගික අරමුණු සහ හේතූන් උදෙසා කැපවූ යම් සංවිධානයක් (සංවිධාන) හෝ රජය (රජයන්) හා එක්ව හෝ ඔවුන් වෙනුවෙන්, යම් රජයකට බලපෑම් කිරීම සහ/හෝ මහජනතාව හෝ යම් ජන කොටසක් බියගැන්වීමට සිදුකෙරෙන ක්‍රියා ඇතුළු ඕනෑම ක්‍රියාවක්.

රජයේ ආරක්ෂක හමුදා සහ ගොඩබිම මුහුද හෝ ගුවන කේන්ද්‍ර කරගත් යම් කණ්ඩායමක් අතර ඕනෑම ගැටුම් තත්වයකදී පාලනය,වැළැක්වීම සහ මර්ධනය උදෙසා ගනු ලබන ඕනෑම පියවරක ඍජු හෝ වක්‍ර බලපෑමක් ලෙස සිදුවන ඕනෑම අහිමිවීමක්, හෝ හානියක්, වියදමක් හෝ කවර ආකාරයේ වැයක්, ත්‍රස්තවාදය යටතේ අර්ථ දැක්වේ.මෙම පිටසන යටතේ ලබාදෙන වන්දිය එක් සේවකයෙකු සඳහා රු.550,000 නොඉක්මවිය යුතුඅතර පොදු නීතිය යටතේ මතුවන නීතිමය වගකීම් හැර සේවයේ දී සිටියදී ඇතිවන සිදුවීම් සඳහා සීමා කෙරේ.

ත්‍රස්තවාදය සම්බන්ධ දිගුව සමාගම විසින් අවලංගු කරනු ලැබුවහොත්, අනුපාතික මුදලක් රක්ෂිතයා වෙත නැවත ගෙවීමට මෙම ඔප්පුවේ වගන්ති වලින් බාධාවක් නොමැත.එහෙත් රක්ෂිතයාගේ ඉල්ලීම මත අවලංගු කරනු ලැබුවහොත්, කිසිදු වාරික මුදලක් යලි ගෙවනු නොලැබේ.මෙහිදී තවදුරටත් එකඟ වී ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙම දිගුව පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත් වේ.

මෙහිදී එකඟවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම දිගුව පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත්වේ.

**A විකිරණශීලී ආපාවනය, රසායනික, ජෛව රසායනික, සහ විද්‍යුත් චුම්භක ආයුධ බැහැර කිරීමේ වගන්තිය.**

මෙම වගන්තිය ප්‍රමුඛ වගන්තියක් වන අතර මෙම රක්ෂණයේ දක්වා ඇති මේ හා නොගැලපෙන යමක් ඇත්නම්, එය නොසලකා හැරේ.

1 කිසිදු අවස්ථාවක පහත සඳහන් කරුණු වලින් හටගන්නා, ඒ නිසා සිදුවූ හෝ ඊට දායකවූ අහිමිවීමක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණ මඟින් ආවරණය නොවේ.

1.11 න්‍යෂ්ටික අපද්‍රව්‍ය හෝ ඕනෑම න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමකින් ඇතිවන විකිරණ ආපාවනයක් හෝ එමඟින් ඇතිවූ අයනීකරණ විකිරණ.

1.12 ඕනෑම න්‍යෂ්ටික පිහිටුවීමක, ප්‍රතික්‍රියාකාරකයක හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ

1.13 පරමාණුක හෝ න්‍යාෂ්ටික විඛණ්ඩනය සහ /හෝ සංයෝජනය හෝ ඊට සමාන ප්‍රතික්‍රියා හෝ විකිරනශීලි බලයක් හෝ පදාර්ථ භාවිතා කරන ආයුධයක් හෝ උපකරණයක්

1.14 ඕනෑම විකිරණශීලි පදාර්ථයක උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාවනශීලි ගති ලක්ෂණ මෙම උප වගන්තියෙන් වන බැහැර කිරීම වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍යමය, විද්‍යාත්මක හෝ එවැනි සාමකාමී කාර්යයක් සඳහා න්‍යාෂ්ටික ඉන්ධන හැර විකිරණශීලි සමස්ථානික සකස් කිරීම රැගෙනයාම හා ගබඩා කිරීමට අදාළ නොවේ.

1.15 ඕනෑම , රසායනික, ජෛව රසායනික, හෝ විද්‍යුත් චුම්භක අවි ආයුධ

**B සයිබර් ආක්‍රමණ බැහැරකිරීමේ වගන්තිය**

1.1 පහත සඳහන් 1.2 වගන්තියට පමණක් යටත්ව යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංගයක්, ද්වේශ සහගතව සකසන ලද පරිගණක කේතයක්. පරිගණක වෛරසයක් හෝ ක්‍රියාවලියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හානිකාරක ක්‍රමවේදයක්ලෙස භාවිතයෙන් හටගන්නා ඊට දායකවූ හෝ ඒ හේතුවෙන් සිදුවූ කිසිදු අහිමිවීමක්, හානියක්, බැරකමක්,හෝ වියදමක් මෙම රක්ෂණාවරණයෙන් ආවරණය නොවේ.

1.2 යුද්ධ, සිවිල් යුද්ධ ,විප්ලව, කැරලි, අභිද්‍රෝහ, හෝ මහජන කැළඹීම්, හෝ වෙනත් රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් ත්‍රස්තවාදය හෝ දේශපාලනික අභිප්‍රායකින් ක්‍රියාත්මක වන පුද්ගලයකුගේ ක්‍රියා ආවරණය කරනු ලබන රක්ෂණාවරණයක මෙම වගන්තිය ඇතුලත් කොට ඇතිවිට 1.1 වගන්තියෙන් කරනු ලබන බැහැර කිරීමට (එසේ නැතිනම් අදාළවන) පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් යම් ආයුධයක හෝ මිසයිලයක දියත් කිරීම සහ / හෝ පාලනය සහ / හෝ වෙඩි තැබීමේ යාන්ත්‍රනය සඳහා භාවිත කිරීමකදී අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන් ලබාදෙන මෙම විශේෂිත දිගුව යටතේ පැනනැගෙන ඕනෑම නීතිමය වගකීමක් අදාළ අරමුදල වෙත පැවරේ. ඕනෑම අහිමිවීමක් හෝ හානියක් මෙම පිටසන මඟින් ආවරණය නොකෙරෙන විට එය මෙමඟින් ආවරණය කෙරෙන බවට පැවරෙන නඩුවක් පැමිණිල්ලක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයකදී එම අහිමිවීම හෝ හානිය මෙමඟින් ආවරණය වන බවට ඔප්පු කිරීම රක්ෂිතයා විසින් සිදුකල යුතුය.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් සහ අත්හැරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

**8 වන වගන්තිය ඇදගෙන යාමේ ගාස්තු**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන ප්‍රකාශ කොට එකඟ වී ඇති පරිදි මෙම ඔප්පුවේ පලවන කොටසේ හතරවන අයිතමයට අදාළව ගෙවිය හැකි උපරිම මුදල ලේඛනයේ දැක්වෙන වගන්ති අත්හැරීම් සහ කොන්දේසි වලට යටත්ව එහි සඳහන් මුදල දක්වා ඉහල නංවා ඇත.

## 9වන වගන්තිය වායු මළු දිගුව (Air Bag)

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන, ප්‍රකාශ කොට එකඟ වී ඇති පරිදි ලිඛිත ඔප්පුවේ සීමාවන් තුළ දක්වා ඇති පරිදි වාහනයට සිදුවන හානියක් හෝ අහිමිවීමක් නිසා වායු මළු (Air Bag) අළුතින් යෙදවීම සඳහා ආවරණය දිගු කිරීමට කටයුතු කෙරේ. එහෙත් ඒ ලිඛිත ඔප්පුවේ ලේඛනයේ සඳහන් කොට ඇති සීමාවන් තුළ පමණි. මෙය වාහනය සම්බන්ධ එක් සිද්ධියකට අදාළ වේ.

## 10වන වගන්තිය සුළංවාමුවා / කවුළු වීදුරු බිඳීම්

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන රක්ෂිතයාගේ වාහනයේ වින්ඩ්ස්ක්‍රීන් වීදුරුවක් හෝ ජනේල වීදුරුවක් වාහනයට වෙනත් හානියක් නොවී බිඳී ගියහොත්, එය නැවත යෙදීමට සහ සිරුණු තැන් ප්‍රතිස්ථාපනයට අවශ්‍ය වියදම සමාගම විසින් ගෙවනු ලැබේ. එය ඔප්පු ලේඛනයේ සඳහන්ව ඇති එක් අවස්ථාවක උපරිම මුදල නොඉක්මවිය යුතුය.එවැනි ගෙවීමක් හිමිකම් අයදුම් නොකිරීමේ ප්‍රසාද (‘NCB’ ) වලට අගතියෙන් තොරව සහ ඔප්පුවේ අමතර මෙහෙයුම් ගාස්තු වලට අයත් නොවේ. ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

## 11 වන වගන්තිය තුන්වන පාර්ශ්වයේ දේපළ හානි

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙහිදී අවබෝධයෙන් එකඟ වී ඇති පරිදි ඔප්පුවේ වගන්ති, අත්හැරීම් සහ කොන්දේසි වලට අනුව රක්ෂිතයා විසින් තුන්වන පර්ශ්වයේ දේපළකට සිදුකල හානියකට එරෙහිව රක්ෂිතයාගේ වියදම් ඇතුළුව සමාගම වන්දි ගෙවයි. රක්ෂිතයා විසින් ලේඛනයේ සඳහන් ඕනෑම වාහනයක් පාවිච්චි කිරීමේදී දේපළකට සිදුකල හානියකට එහි අලාභය ගෙවීම සඳහා රක්ෂිතයාට නීතිමය වගකීමක් පැවරුනහොත් මෙම වන්දි පිරිනැමීම සිදුවනු ඇත. එක් සිද්ධියකදී එසේ ගෙවන වන්දි මුදල ලේඛනයේ සඳහන් මුදලට සීමාවේ.

## 12 වන වගන්තිය පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙහිදී අවබෝධයෙන් එකඟ වී ඇති පරිදි ශාරීරික තුවාල සඳහා පහත දැක්වෙන සටහනට අනුව සමාගම විසින් වන්දි පිරිනමයි. ලේඛනයේ දක්වා ඇති වාහනයකට ගොඩවීමේදී, බැසීමේදී හෝ ගමන්කිරීමේදී ලේඛනයේ සඳහන් ඕනෑම පුද්ගලයෙකුට දැඩි අනතුරකින්, බාහිර සහ දෘශ්‍යමාන ලෙස ස්වාධීනව හෝ වෙනත් ආකාරයකින් සිදුවන ශාරීරික තුවාල සඳහා මෙම වන්දි ගෙවීම් සිදු කෙරේ. (එවැනි තුවාල හේතුවෙන් සිදු කෙරෙන වෛද්‍ය ප්‍රතිකාර සහ ශල්‍ය ගාස්තු හැර ) අදාළ සිද්ධියෙන් ලිත් මාස තුනක් ඇතුළත පමණක් මෙම ගෙවීම් සිදු කෙරේ.

### වන්දි ලබාදීමේ පරිමාණය

(මෙම වගන්තියට අනුව ඔප්පු ලේඛනයේ සඳහන් රක්ෂිත මුදලට අදාළ වේ.)

1. මරණය 100%
2. සම්පූර්ණ සහ නැවතත් ප්‍රකෘතිමත් කළ නොහැකි පරිදි ඇස් දෙකෙහිම පෙනීම නැතිවීම හෝ අත් දෙකෙහිම හෝ දෙපාවල මැණික් කටු සහ වළලුකර අසලින් හෝ ඊට ඉහලින් කපා ඉවත් කිරීම හෝ එක් අතක සහ පාදයක එසේ කපා ඉවත් කිරීමක් තුළින් සම්පූර්ණ අහිමිවීම.100%
3. එක් අතක හෝ පාදයක මැණික් කටුව හෝ වළලුකර අසලින් හෝ ඊට ඉහලින් කපා ඉවත් කිරීම නිසා සම්පූර්ණ අහිමිවීම හෝ එක් ඇසක පෙනීම සම්පූර්ණයෙන් සහ නැවත ප්‍රකෘතිමත් කළ නොහැකි අන්දමින් නැතිවීම.50%

මෙහිදී සැමවිටම

a) එක් පුද්ගලයෙක් සඳහා ඕනෑම එක් අවස්ථාවකදී පැනනැගෙන (1) සිට (3) දක්වා එක් අංශයක් යටතේ පමණක් වන්දි ගෙවීම් සිදුකෙරෙනු ඇත. එහිදී සමාගමේ සමස්ථ වගකීම් ලේඛනයේ සඳහන් වන්දියට සාපේක්ෂව ඉහත සටහනේ දක්වා ඇති ප්‍රතිශතය නොඉක්මවිය යුතුය.

b) සිතාමතා සිදුකරගන්නා ලද තුවාල, දිවි නසාගැනීම (අපරාධයක් වුවත් නැතත් )හෝ දිවිනසා ගැනීමට උත්සාහ කිරීම කායික අබාධ සහ දුර්වලතා මෙන්ම මත්වීමට හේතුවන මත්පැන් හෝ මත්ද්‍රව්‍ය වල බලපෑමට යටත්ව සිටින අතර අනතුරට ලක්වීමෙන් ඍජුව හෝ අනියම් ආකාරයෙන් සිදුවන ශාරීරික තුවාල හෝ මරණය වෙනුවෙන් කිසිදු මුදලක් ගෙවනු නොලැබේ.

c) එවැනි වන්දියක් රක්ෂිතයාගේ අවසර ඇතිව ඍජුවම තුවාල ලැබූ පුද්ගලයාට හෝ ඔහුගේ නීතිමය නියෝජිතයා වෙත ගෙවනු ලබන අතර ඔහුගේ ලදුපත තුවාල ලැබූ පුද්ගලයාට මුළු වන්දිය ලබාදීමේ අවසන් පියවර වනු ඇත.

d) අදාළ වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් මඟින් සංඛ්‍යාව, සිද්ධිය වූ අවස්ථාවේදී නොඉක්මවා තිබිය යුතු අතර, එය මගීන් සඳහා ලබාගත් ආවරණයට පමණක් අදාළ වනු ඇත.

e) මරණයට පත්වුන හෝ තුවාල ලබන අවස්ථාවේ අදාළ පුද්ගලයා අවුරුදු 16 ඉක්මවා සිටිය යුතු අතර වයස අවුරුදු 65 නොඉක්මවා සිටිය යුතුය.

f) මෙම ඔප්පුව යටතේ ඇති වැඩ වර්ජන, කැරලි කෝලාහල, මහජන කැළඹීම් සහ ත්‍රස්තවාදය දීර්ඝ කිරීම මෙම වගන්තිය සඳහාද විශේෂයෙන් ආවරණය කර නොමැති නම්, එය එම වගන්තිය සඳහා අදාල නොවේ.

**13 වන වගන්තිය මගී අවදානම (මගීන් ගෙන යන වාහන සඳහා )**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ 2C කොටසේ 1(ii)(c) උපකොටසේ අඩංගු කරුණු වලට පරස්පර නොවන පරිදි ඔප්පුවේ අනිකුත් වගන්ති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව ආවරණය ලබා ඇති රක්ෂිතයා හෝ එසේ ආවරණ ලැබූ වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් ඉල්ලුම් කරන්නාගේ වියදම් සහ ගාස්තු ඇතුළුව වන්දි වගකීම් දැරීමට සමාගම කටයුතු කරනු ඇත.

එය ලේඛනයේ /වල සඳහන් පුද්ගලයෙකු වාහනයට ගොඩවන බසින හෝ ගමන් කරන අවස්ථාවක ලබන ශාරීරික තුවාල හෝ මරණය වෙනුවෙන් නීතිමය වශයෙන් ගෙවිය යුතු වන්දියට අදාළය. නමුත් එවැනි වන්දියක් ලේඛනයේ විශේෂයෙන් සඳහන් කර ඇති එක් මඟියකු සඳහා වන නිශ්චිත මුදලට සීමාවේ.

මෙහිදී සැමවිටම අනතුරට මුහුන දුන් වාහනය ලේඛනයේ /වල සඳහන් කල ආසන සංඛ්‍යාව ඉක්මවා (කොන්දොස්තර,සහායකයකු ඇත්නම් සහ රියදුරු හැර ) මඟින් රැගෙන ගොස් ඇත්නම් එවැනි වාහනයකට සම්බන්ධ අනතුරකදී මෙම වගන්තිය යටතේ සමාගමට ගෙවීමට සිදුවන මුදලින් තක්සේරු කල කොටසක් රක්ෂිතයා විසින් යලි සමාගමට ගෙවිය යුතුය.

**14 වන වගන්තිය - ඉවත් කරන ලද අයිතම (කුලී වාහන සඳහා පමණයි.)**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙහිදී ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි ලාම්පු, ටයර්, මඩ්ගාඩ්, බෆර්, බෆර්

ඇමිණුම්, බෆර් ආරක්ෂණ සහ හෝ තීන්ත ආලේපන සඳහා සමාගම විසින් රක්ෂිතයාට වන්දි ගෙවයි.

මෙහිදී සෑම හිමිකම් අයදුමක් සඳහාම රුපියල් 1000 ක අතිරික්තයකට යටත්ව සමාගම විසින් හානිපුරණය කරනු ලබයි.

වෙනත් අතිරික්ත වියදම් මෙහිදී සැලකිල්ලට නොගැනේ.

**15 වන වගන්තිය - කුලී වාහන - කුලී වාහන පැදවීම.**

මෙම ඔප්පුවේ ප්‍රතිපාදන වලට පටහැනි නොවන සේ එකඟත්වය ඇතිවී තිබෙන පරිදි අමතර වාරිකයක් ගෙවා ඇති රක්ෂිතයා විසින් ලේඛනයේ දක්වා ඇති වාහනයක් ඔහුගේ අනුදැනුම ඇතිව හෝ සිය සේවකයකුගේ අනුදැනුම මත වෙනත් අයකු විසින් පදවාගෙන යනු ලබන විටද රක්ෂණාවරණය ක්‍රියාත්මක වන අතර එසේ ක්‍රියාත්මක වන්නේ එම වාහනය පහත කරුණු සම්පූර්ණ කොට ඇතිවිට පමණි. රක්ෂිතයා විසින් වෙනත් ඕනෑම පුද්ගලයෙකු (මින් ඉදිරියට කුලීකරු ලෙස හඳුන්වනු ලබන අතර) වෙත කුලියට දුන් විට,

(1)රක්ෂිතයා සමඟ කුලී කොන්ත්‍රාත්තුවකට අත්සන් කර ඇත්නම්

(2) රක්ෂිතයා සෑහීමකට පත්වන පරිදී

(a) වාහනය රිය පැදවීම සඳහා නිසි බලපත්‍රයක් සහිත පුද්ගලයකු විසින් පදවාගෙන යන විට

(b)එම පුද්ගලයාට මෝටර් වාහන රක්ෂණාවරණයක් ප්‍රතික්ෂේප වී නොතිබීම හෝ ඔහුගේ රක්ෂණ අවලංගු කර නොතිබීම හෝ අදාළ පුද්ගලයා පිළිබඳ හිමිකම් අත්දැකීම් තුළින් රක්ෂණය සඳහා විශේෂ කොන්දේසි පැනවීමක් හෝ වාරිකය ඉහල නැංවීමක් සිදුකර නොමැතිවිට එය බලපැවැත්වේ.

එවැනි වාහනයක් කුලීකරුවෙකු වෙත කුලියට ලබාදුන් විට පහත අවස්ථාවන්හිදී සමාගම වගකීම නොදරයි.

i කුලීකරු විසින් මාරු කිරීම නිසා හෝ සොරකම් කිරීම හේතුවෙන් පැනනගින අහිමිවීමක් හානියක් හෝ නීතිමය වගකීමක්

ii එවැනි වාහනයක් කුලීකරු විසින් කුලියක් හෝ ප්‍රතිලාභයක් වෙනුවෙන් මගීන් සහ / හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා විට.

මෙහිදී අවබෝධයෙන් එකඟවී ඇති පරිදි මෙම ඔප්පුව යටතේ ඕනෑම නීතිමය වගකීමක් සඳහා ඉහත සඳහන් කුලී කොන්ත්‍රාත්තුවේ සහතික කල පිටපතක් රක්ෂිතයා විසින් වහා සමාගම වෙත ඉදිරිපත් කල යුතු අතර එය කුලීකරු විසින්ද සම්පූර්ණ කල යුතු වේ. එමෙන්ම එවැනි වාහනයක් කුලියට ලබාදී ධාවනය කිරීමේදී සිදුවන අනතුරකින් වන්දි ලබාගැනීමට අදාළ වගන්ති සහිත ඔප්පු ප්‍රකාශනය සහ යෝජනා පත්‍රයද සමාගම වෙත ඉදිරිපත් කිරීම පූර්වාදර්ශ කොන්දේසියකි.

පහත අනිවාර්ය අතිරික්තයන්ද අදාළවේ.

යතුරු පැදි සඳහා රු 2000

අනිකුත් සියළු වාහන රු 5000

**16 වන වගන්තිය - මාර්ගස්ථ භාණ්ඩ (අනතුරු රහිත)**

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ වගන්ති කොන්දේසි බැහැරකිරීම් සහ අත්හැරීම්වලට යටත්ව මෙමඟින් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි ලේඛනයේ සඳහන් වාහනයක් මඟින් භාණ්ඩ ප්‍රවාහනය කරද්දී එවැනි වාහනයක් වෙනත් යමක සෘජුව ගැටී හෝ පෙරලී හානියට පත්වූ (සෘජුව හෝ වක්‍රාකාරව ගින්නකට ගොදුරුවීම, පිපිරීමකට ලක්වීම හෝ වර්ජන, කළහ සහ සිවිල් කෝලාහල හෝ ත්‍රස්තවාදය නිසා සිදුවන හානි හැර ) වාහනය වෙනුවෙන් වන්දි ලැබීම සඳහා රක්ෂිතයා

ආවරණය කෙරේ. නමුත් මෙම වන්දිය එක් අවස්ථාවක් සඳහා ලේඛනයේ සඳහන් සීමාවට යටත් වේ.

මෙහිදී අනතුර සිදුවන විට අදාළ වාහනය මඟින් රැගෙන යමින් තිබූ භාණ්ඩ වල වටිනාකම රක්ෂිත වටිනාකම අභිබවා යන්නේ නම්, රක්ෂිතයා තමාගේ රක්ෂකයා ලෙස ක්‍රියා කරමින් එවැනි හානියක තක්සේරු ප්‍රතිශතයක් ඊට අනුකූලව දරාගත යුතුය.

මෙහිදී තවදුරටත් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි පහත සඳහන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේදී සිදුවන හානි සඳහා මෙම වගන්තිය යටතේ සමාගම වගකීමක් නොදරයි.

ඔරලෝසු

වීදුරු භාණ්ඩ

විසිතුරු භාණ්ඩ

ස්වර්ණාභරණ

වයින් හෝ ස්ප්‍රිතු

ගෘහ භාණ්ඩ

පශු සම්පත්

විද්‍යාත්මක උපකරණ

පිගන් භාණ්ඩ හෝ මැටි භාණ්ඩ

විදුලි උපකරණ හෝ උපාංග

පින්තූර,මුද්‍රණ සහ සිතුවම්

විදුරු බහලුම් තුළ ඇති භාණ්ඩ

ඉන්ධන

කොහු

කපු අපද්‍රව්‍ය

කඩදාසි අපද්‍රව්‍ය

පුපුරන ද්‍රව්‍ය

මෙම වගන්තියේ සිදුවීම යන්නෙන් අදහස් කරන්නේ, ඒ යටතේ වන්දි හිමිකම් ආවරණ සහිත එක් වාහනයක එක් සිද්ධියක් මුල් කරගෙන ඒ තුලින් මතුවූ සිදුවීම් මාලාවක් විය හැක.

## 17 වන වගන්තිය - මාර්ගස්ථ භාණ්ඩ (අනතුරුදායක )

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ වගන්ති කොන්දේසි බැහැරකිරීම් සහ අත්හැරීම්වලට යටත්ව මෙමඟින් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි ලේඛනයේ සඳහන් වාහනයක් මඟින් භාණ්ඩ ප්‍රවාහනය කරද්දී එවැනි වාහනයක් වෙනත් යමක සෘජුව ගැටී හෝ පෙරලී හානියට පත් (සෘජුව හෝ වක්‍රාකාරව ගින්නකට ගොදුරුවීම, පිපිරීමකට ලක්වීම හෝ වර්ජන, කළහ සහ සිවිල් කෝලාහල හෝ ත්‍රස්තවාදය නිසා සිදුවන හානි හැර ) වාහනය වෙනුවෙන් වන්දි ලැබීම සඳහා රක්ෂිතයා ආවරණය කෙරේ. නමුත් මෙම වන්දිය එක් අවස්ථාවක් සඳහා ලේඛනයේ සඳහන් සීමාවට යටත් වේ.

මෙහිදී අනතුර සිදුවන විට අදාළ වාහනය මඟින් රැගෙන යමින් තිබූ භාණ්ඩ වල වටිනාකම රක්ෂිත වටිනාකම අභිබවා යන්නේ නම්, රක්ෂිතයා තමාගේ රක්ෂකයා ලෙස ක්‍රියා කරමින් එවැනි හානියක තක්සේරු ප්‍රතිශතයක් ඊට අනුකූලව දරාගත යුතුය.

මෙම වගන්තියේ සිදුවීම යන්නෙන් අදහස් කරන්නේ ඒ යටතේ වන්දි හිමිකම් ආවරණ සහිත එක් වාහනයක එක් සිද්ධියක් මුල් කරගෙන ඒ තුලින් මතුවූ සිදුවීම් මාලාවක් විය හැක.

විශේෂයෙන් ආවරණයක් ලබා නොමැති නම්, මෙම වගන්තිය යටතේ ඉන්ධන, කොහු, කපු අපද්‍රව්‍ය, කඩදාසි අපද්‍රව්‍ය, පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහන සහ වර්ජන කළහ හෝ මහජන කැළඹීම්

හේතුවෙන් ඇතිවන අනතුරු වලට ආවරණයක් ලබා නොදේ.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

### 18 වන වගන්තිය - මාර්ගස්ථ භාණ්ඩ ත්‍රස්තවාදී ආවරණය

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙහිදී අවබෝධයෙන් ප්‍රකාශයට පත් කරන පරිදි මෙම ඔප්පුවට අමුණන ලද වර්ජන, සිවිල් කෝලාහල සහ ත්‍රස්තවාදී පිටසන එයින් පිරිනමන ආවරණය ලබාදීම සඳහා මෙමඟින් බලාත්මක කෙරේ. කෙසේ නමුත් වර්ජන කළහ හෝ මහජන කැළඹීම් පිටසන සහ ත්‍රස්තවාදී ආවරණ පිටසන හැර පැනනගින ඕනෑම හිමිකම් අයදුමක් ගෙවීමට සමාගම බැඳී නොසිටින අතර රක්ෂිත භාණ්ඩ වලට සිදුවන සෑම හානියකදිම රු. 5000ක අවමයක් සහිත පළමු 10% රක්ෂිතයා විසින් දරාගත යුතුය.

ඕනෑම එක් අහිමිවීමට අදාළ සමාගමේ නීතිමය වගකීම, රු.මිලියන පහක උපරිමයක් හෝ රක්ෂිත මුදල යන දෙකින් අවමය වේ.

මේ යටතේ හිමිකම් අයදුමක් පැනනගින ඕනෑම සිද්ධියකදී රක්ෂිතයා විසින් රක්ෂිත මුදල සඳහා ගණනය කරන ලද අමතර වාරිකයක් ගෙවා මෙම රක්ෂණය පුනස්ථාපනය කල යුතුය.

ඔප්පුවේ සඳහන්ව ඇති නමුදු, ඒ සඳහා ලබාදී ඇති ත්‍රස්තවාදී ආවරණ දිගුව රක්ෂකයා විසින් අවලංගු කල හැකි අතර එහිදී තක්සේරු කළ මුදලක් රක්ෂිතයා වෙත නිකුත් කිරීමට අවසර ලැබේ. එහෙත් රක්ෂිතයාගේ ඉල්ලීම මත එම දිගුව අවලංගු කලහොත් වාරික මුදල් කිසිවක් ආපසු ගෙවනු නොලැබේ.

තවදුරටත් එකඟවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම දිගුව පහත බැහැර කිරීම් වලට යටත් වේ.

මෙහිදී එකඟවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම දිගුව පහත දැක්වෙන බැහැර කිරීම් වලට යටත්වේ.

### A විකිරණශීලී ආපාචනය, රසායනික, ජෛව රසායනික, සහ විද්‍යුත් චුම්භක ආයුධ බැහැර කිරීමේ වගන්තිය.

මෙම වගන්තිය ප්‍රමුඛ වගන්තියක් වන අතර මෙම රක්ෂණයේ දක්වා ඇති මේ හා නොගැලපෙන යමක් ඇත්නම්, එය නොසලකා හැරේ.

1 කිසිදු අවස්ථාවක පහත සඳහන් කරුණු වලින් හටගන්නා, ඒ නිසා සිදුවූ හෝ ඊට දායකවූ අහිමිවීමක්, හානියක්, වගකීමක් හෝ වියදමක් මෙම රක්ෂණ මඟින් ආවරණය නොවේ.

1.16 න්‍යෂ්ටික අපද්‍රව්‍ය හෝ ඕනෑම න්‍යෂ්ටික ඉන්ධන දහනය කිරීමකින් ඇතිවන විකිරණ ආපාචනයක් හෝ එමඟින් ඇතිවූ අයනීකරණ විකිරණ.

1.17 ඕනෑම න්‍යෂ්ටික පිහිටුවීමක, ප්‍රතික්‍රියාකාරකයක හෝ වෙනත් න්‍යෂ්ටික එකලස් කිරීමක හෝ උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාචනශීලි ගති ලක්ෂණ

1.18 පරමාණුක හෝ න්‍යෂ්ටික විඛණ්ඩනය සහ /හෝ සංයෝජනය හෝ ඊට සමාන ප්‍රතික්‍රියා හෝ විකිරනශීලි බලයක් හෝ පදාර්ථ භාවිතා කරන ආයුධයක් හෝ උපකරණයක්

1.19 ඕනෑම විකිරණශීලි පදාර්ථයක උපාංගයක විකිරණශීලි විෂ සහිත, පිපිරිය හැකි හෝ වෙනත් උපද්‍රවශීලි හෝ ආපාචනශීලි ගති ලක්ෂණ මෙම උප වගන්තියෙන් වන බැහැර කිරීම වාණිජ, කෘෂිකාර්මික, වෛද්‍යමය, විද්‍යාත්මක හෝ එවැනි සාමකාමී කාර්යයක් සඳහා න්‍යෂ්ටික ඉන්ධන හැර විකිරණශීලි සමස්ථානික සකස්

කිරීම රැගෙනයාම හා ගබඩා කිරීමට අදාළ නොවේ.

1.20 ඕනෑම , රසායනික, ජෛව රසායනික,හෝ විද්‍යුත් චුම්භක අවි ආයුධ

**B සයිබර් ආක්‍රමණ බැහැරකිරීමේ වගන්තිය**

1.1 පහත සඳහන් 1.2 වගන්තියට පමණක් යටත්ව යම් පරිගණකයක්, පරිගණක පද්ධතියක්, පරිගණක මෘදුකාංගයක්, ද්වේශ සහගතව සකසන ලද පරිගණක කේතයක්. පරිගණක වෛරසයක් හෝ ක්‍රියාවලියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක් හානිකාරක ක්‍රමවේදයක් ලෙස භාවිතයෙන් හටගන්නා ඊට දායකවූ හෝ ඒ හේතුවෙන් සිදුවූ කිසිදු අහිමිවීමක්, හානියක්, බැරකමක්,හෝ වියදමක් මෙම රක්ෂණාවරණයෙන් ආවරණය නොවේ.

1.2 යුද්ධ, සිවිල් යුද්ධ ,විප්ලව, කැරලි, අභිද්‍රෝහ, හෝ මහජන කැළඹීම්, හෝ වෙනත් රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් ත්‍රස්තවාදය හෝ දේශපාලනික අභිප්‍රායකින් ක්‍රියාත්මක වන පුද්ගලයකුගේ ක්‍රියා ආවරණය කරනු ලබන රක්ෂණාවරණයක මෙම වගන්තිය ඇතුලත් කොට ඇතිවිට 1.1 වගන්තියෙන් කරනු ලබන බැහැර කිරීමට (එසේ නැතිනම් අදාළවන) පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පද්ධතියක පරිගණක මෘදුකාංග වැඩසටහනක් යම් ආයුධයක හෝ මිසයිලයක දියත් කිරීම සහ / හෝ පාලනය සහ / හෝ වෙඩි තැබීමේ යාන්ත්‍රනය සඳහා භාවිත කිරීමකදී අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන් ලබාදෙන මෙම විශේෂිත දිගුව යටතේ පැනනැගෙන ඕනෑම නීතිමය වගකීමක් අදාළ අරමුදල වෙත පැවරේ. ඕනෑම අහිමිවීමක් හෝ හානියක් මෙම පිටසන මඟින් ආවරණය නොකෙරෙන විට එය මෙමඟින් ආවරණය කෙරෙන බවට පැවරෙන නඩුවක් පැමිණිල්ලක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයකදී එම අහිමිවීම හෝ හානිය මෙමඟින් ආවරණය වන බවට ඔප්පු කිරීම රක්ෂිතයා විසින් සිදුකල යුතුය.

ඔප්පුවේ අනිකුත් වගන්ති, කොන්දේසි සහ බැහැර කිරීම් සහ අත්හැරීම් ඒ අයුරින්ම ක්‍රියාත්මකයි.

**19 වන වගන්තිය - මාර්ග ධාවන බලපත්‍ර සහිත බස්රථ**

මෙහිදී එකහවී ප්‍රකාශයට පත් කරන පරිදි මෙම ඔප්පුවේ 2 (C කොටසේ ) අඩංගු කරුණු වලට පරස්පර නොවන ලෙස, එහෙත් මෙම ඔප්පුවේ වගන්ති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව ලේඛනයේ දැක්වෙන වාහනයකට නැගීමේදී, රැගෙන යන විට සහ බැසයාමේදී සිදුවන අනතුරකින් ශාරීරික තුවාල, දේපළ හානි හෝ මරණය සිදුවන මඟියකු වෙනුවෙන් සමාගම රක්ෂිතයාට වන්දි ගෙවයි. ඔප්පුවේ 2 වන කොටසට අදාළව හිමිකම් ඉල්ලන්නන්ගේ වැය සහ වියදම් ඇතුළුව රක්ෂිතයාට නීතිමය වශයෙන් ගෙවීමට සිදුවිය හැකි වගකීම්ද ඊට ඇතුලත්ය.

මෙහිදී සෑමවිටම අදාළ වාහනය අනතුරට පත්වන අවස්ථාවේ, ලියාපදිංචි සහතිකයේ සඳහන් ආසන සංඛ්‍යාවට (කොන්දොස්තර / සහයක / රියදුරුට අමතරව) වඩා රැගෙන ගියේ නම්, එම වාහනයට අදාළ අනතුර වෙනුවෙන් මෙම වගන්තිය යටතේ සමාගම ගෙවිය යුතු මුළු මුදලෙන් තක්සේරු කල ප්‍රතිශතයක් රක්ෂිතයා විසින් සමාගමට ගෙවිය යුතුය.

මෙම දිගුව සැලකීමේදී ඔප්පුවේ 1කොටස යටතේ වෙනත් ඕනෑම අතිරික්තයකට පරිබාහිරව සෑම හිමිකම් අයදුමකදීම රක්ෂිතයා විසින් රු.1500ක අනිවාර්ය අතිරික්තයක් දරාගත් යුතුය.

**20 වන වගන්තිය - අමතර කොටස් හෝ සොරකම් ආවරණ දිගුව (පුද්ගලික ද්විත්ව කාර්ය වාහන සඳහා පමණයි.)**

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙමඟින් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි සොරකම්, නිවාස බිඳීම්, ආදි සිද්ධියකදී වාහනය සොරාගෙන නොමැතිවිට, වාහනයේ උපාංග, අමතර කොටස්, හෝ අනුකලන කොටස් වලට සිදුවන හානිය හෝ අහිමිවීම ආවරණය කිරීම සඳහා මෙම ඔප්පුවේ ආවරණය දිගු කෙරේ.

එහිදී අමතර වියදම් සැළකිල්ලට නොගෙන ඔප්පුවේ වගන්ති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව සෑම හිමිකම් අයදුමටම පළමු රු.2000 සඳහා රක්ෂිතයා වගකීම් දැරිය යුතුය.

**21 වන වගන්තිය - පුහුණුවන රියදුරු / පැදිකරු**

අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන මෙමඟින් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි ලිඛිත ඔප්පුවට පරස්පර නොවන ආකාරයෙන් ලේඛනවල සඳහන් කර ඇති පුද්ගලයා / පුද්ගලයන් ලේඛනයේ දක්වා ඇති වාහනයක් පැදවීමට ඉගනගන්නා විට මෝටර් වාහන පනතේ රියදුරු / පැදිකරු පුහුණුවට අදාළ අවශ්‍යතාවන්ට අනුකූලව මෙම ඔප්පුව දිගු කෙරේ.

රක්ෂණ ඔප්පුවේ මෙම දිගුව සැලකීමේදී රු 2500 හෝ ඊට අඩු පළමු වැය සඳහා රක්ෂිතයා විසින් වගකීම දැරිය යුතුය. මෙම ඔප්පුවේ 1වැනි සහ 2වැනි කොටස් යටතේ සඳහන් වැය ඊට අදාළය. වැය සහ වියදම් සඳහා කල ගෙවීම්ද ඊට ඇතුලත්ය. මෙම ඔප්පුවේ 2වන වගන්තිය යටතේ සමාගමේ අභිමතය ක්‍රියාත්මක කිරීමේදී සිදුකෙරෙන වියදම්ද මීට අයත් වේ. ලේඛනයේ /වල සඳහන් කර ඇති පුද්ගලයා / පුද්ගලයන් සම්බන්ධ සෑම සිදුවීමක් සම්බන්ධවම මෙය අදාළය.

සමාගමට මෙහිදී දැරීමට සිදුවන වැයට රක්ෂිතයා වගකිය යුතු වියදම්ද ඇතුලත් වුවහොත් එම මුදල රක්ෂිතයා විසින් වහාම ආපසු ගෙවිය යුතුය.

මෙම වගන්තියේ සිදුවීම යන්නෙන් අදහස් කරන්නේ ඒ යටතේ වන්දි හිමිකම් ආවරණ සහිත එක් වාහනයක එක් සිද්ධියක් මුල් කරගෙන ඒ තුලින් මතුවූ සිදුවීම් මාලාවක් විය හැක. මෙම වගන්තිය යටතේ රක්ෂිතයා වගකීමක් දරන ප්‍රමාණය ඔප්පුවේ දැනටමත් අඩංගු අමතර වගන්තිවලට අතිරේකව එක්වන්නකි.

**22වන වගන්තිය කුලී සින්නක්කර / කල්බදු**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන, අවබෝධයෙන් එකඟවූ පරිදි ලේඛනයේ සඳහන් ආයතනය (මින් ඉදිරියට හිමිකරුවන් ලෙස හඳුන්වන) එහි දැක්වෙන වාහනයේ හිමිකරුවන් ලෙස සැලකේ. එමෙන්ම අදාළ වාහනය හිමිකරුවන් එක් පාර්ශ්වයකින් සහ රක්ෂිතයා අනිත් පාර්ශ්වයෙන් ඇතිකරගත් කුලී සින්නක්කර / කල්බදු ගිවිසුමකට යටත් වේ. එමෙන්ම වාහනයට සිදුව ඇති අලාභ හානි එය අළුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිස්ථාපනය කිරීමට නුසුදුසු තත්වයට පත්කර ඇත්නම්, මෙම ඔප්පුවේ වගන්ති වලට අනුව එම අලාභහානි වෙනුවෙන් රක්ෂිතයාට ගෙවිය යුතු මුදල හිමිකරුවන්ට ලැබියයුතු බවට එකඟ වී තිබේ. වාහනයේ හිමිකරුවන් ලෙස සිටිනතාක් වෙනත් වාහනයක් යෙදවීම ඇතුළු අලාභ හානි වෙනුවෙන් සමාගම මුදාහරින සම්පූර්ණ සහ අවසාන මුදල ඔවුන් වෙත ගෙවනු ලැබේ.

මෙම වගන්තියට අනුව විශේෂයෙන් එකඟ වී ඇති පරිදි ඔප්පුවේ සඳහන් රක්ෂිතයාගේ සහ සමාගමේ හිමිකම් සහ වගකීම්වලට බලපාන කොන්දේසි හෝ වගන්ති වෙනස් කිරීමක් හෝ සැකසීමක් සිදුකල නොහැක.

**23වන වගන්තිය - රිය පැදවීම පුහුණුව**

රක්ෂිතයා විසින් අමතර වාරිකයක් ගෙවීම සැලකිල්ලට ගෙන, මෙහිදී එකඟත්වය පළකර ඇති පරිදි ලිඛිත ඔප්පුවේ වගන්තිවලට පටහැනි නොවන පරිදි රක්ෂිතයා හෝ ඔහුගේ අවසරලත් නියෝජිතයකු විසින් ලේඛනයේ සඳහන් වාහනයක් රිය පැදවීම ඉගැන්වීම සඳහා යොදාගන්නා විටද ලිඛිත ඔප්පුව බලාත්මක කිරීම සඳහාආවරණය මෙමඟින් දිගු කෙරේ. 1951 අංක 14 දරන මෝටර් වාහන පණතේ (සංශෝධිත) රිය පුහුණුවට අදාළ අවශ්‍යතාවයන්ට අනුකූලව අදාළ රිය පුහුණුව ක්‍රියාත්මක විය යුතුය.

මෙම දිගුව සැලකීමේදී මෙම ඔප්පුව යටතේ ඇති වෙනත් අතිරික්තයන්ට බාහිරව සෑම හිමිකම් අයදුමකදිම රක්ෂිතයා විසින් මුල් රු.2500 වැය දරාගත යුතුය.

## 24 වන වගන්තිය - ආයතනික ණය උකස්

මෙහිදී අවබෝධයෙන් එකඟත්වය පළකර ඇති පරිදි ලේඛනයේ සඳහන් වාහනය ඇපයක් ලෙස තබා ලේඛනයේ දක්වා ඇති ආයතනය වෙතින් මුදලක් ලබාගෙන ඇත්නම්, එම වාහනය සම්බන්ධයෙන් අයිතියක් ඇති තාක් කල් වාහනයට සිදුවූ (අළුත්වැඩියා කිරීමෙන්, යථා තත්වයට පත්කිරීමෙන්, ප්‍රතිස්ථාපනය කිරීමෙන් පිරිමසින ලද අලාභය හෝ හානිය) අලාභයක් හෝ හානියක් උදෙසා මෙම ඔප්පුව යටතේ රක්ෂිතයාට ගෙවිය හැකි සියළුම මුදල් සම්බන්ධයෙන් අයිතියක් දක්වන අතර එම ආයතනයට ගෙවිය යුතු අදාළ මුදල් තමාට ලැබුන බවට අදාළ ආයතනය මඟින් සහතික කිරීම එවැනි හානියක් හෝ අහිමිවීමක් වෙනුවෙන් සමාගමේ පූර්ණ සහ අවසන් වගකීම් මුදාහැරීම ලෙස සැලකිය යුතුය.

## 25 වන වගන්තිය - ස්වේච්චා අතිරික්තය නැවත ගෙවීම

මෙම රක්ෂණ ඔප්පුවේ පලවන සහ දෙවන කොටස්වල අඩංගු කරුණු වලට පටහැනි නොවන ලෙස අවබෝධයෙන් එකඟවී ඇති පරිදි සෑම සිදුවීමකදීම මේ යටතේ ප්‍රතිපාදන සලසා ඇති (වැය සහ අනිකුත් වියදම්වලට අදාළ ගෙවීම් ඇතුළුව) ලේඛනයේ සඳහන් මුදල සහ (හෝ එලෙස සිදුකල ඊට වැඩ අඩු වැයක් ) ඔප්පුවේ 4 වන කොන්දේසිය යටතේ සමාගම සිය අභිමතය ක්‍රියාත්මක කිරීමේදී සිදුකරන වැයක් වේ නම් රක්ෂිතයා ඊට වගකීම දරයි.

සමාගමට මෙහිදී දැරීමට සිදුවන වැයට රක්ෂිතයා වගකිය යුතු වියදම්ද ඇතුලත් වුවහොත් එම මුදල රක්ෂිතයා විසින් වහාම ආපසු ගෙවිය යුතුය.

මෙම වගන්තියට අදාළව සිදුවීම යන්නෙන් අදහස් කරන්නේ ඒ යටතේ වන්දි හිමිකම් ආවරණ සහිත එක් වාහනයක එක් සිද්ධියක් මුල් කරගෙන ඒ තුලින් මතුවූ සිදුවීම් මාලාවක් විය හැක.

## 26 වන වගන්තිය - අනිවාර්ය අතිරික්ත

මෙහිදී අවබෝධයෙන් එකඟත්වය පළකර ඇති පරිදි මෙම රක්ෂණ ඔප්පුවේ පලවන කොටසේ අඩංගු කරුණු වලට පටහැනි නොවන ලෙස සෑම සිදුවීමකදීම මේ යටතේ ප්‍රතිපාදන සලසා ඇති (වැය සහ අනිකුත් වියදම්වලට අදාළ ගෙවීම් ඇතුළුව) ලේඛනයේ සඳහන් මුදල සහ (හෝ එලෙස සිදුකල ඊට වඩා අඩු වැයක් ) ඔප්පුවේ 4 වන කොන්දේසිය යටතේ සමාගම සිය අභිමතය ක්‍රියාත්මක කිරීමේදී සිදුකරන වැයක් වේ නම් රක්ෂිතයා ඊට වගකීම දරයි.

සමාගමට මෙහිදී දැරීමට සිදුවන වැයට රක්ෂිතයා වගකිය යුතු වියදම්ද ඇතුලත් වුවහොත් එම මුදල රක්ෂිතයා විසින් වහාම ආපසු ගෙවිය යුතුය.

මෙම වගන්තියේ සිදුවීම යන්නෙන් අදහස් කරන්නේ ඒ යටතේ වන්දි හිමිකම් ආවරණ සහිත එක් වාහනයක එක් සිද්ධියක් මුල් කරගෙන ඒ තුලින් මතුවූ සිදුවීම් මාලාවක් විය හැක

**27 වන වගන්තිය - තීරු බදු රහිත වාහන**

මෙමඟින් ප්‍රකාශ කර එකඟ වී ඇති පරිදි රක්ෂිතයා විසින් දේශීය තීරු බදු රහිතව ලබාගන්නා ලද ලේඛනයේ සඳහන් වාහනය උපාංග සහ අමතර කොටස්වල ඇස්තමේන්තුගත අගය සමාගම වෙත හෙළිදරව් කල යුතුය.

ඉහත සඳහන් කරුණ සැලකිල්ලට ගෙන මෙම ඔප්පුවේ පලවන කොටස යටතේ රක්ෂණ හිමිකම් ඉල්ලා සිටීමකට අදාළව අමතර කොටස් නැවත යෙදවීමේ අවශ්‍යතාවයක් මතුවූ විට සමාගම විසින් ඒ සඳහා දරන වගකීමට දේශීය තීරු බදු ගාස්තු ඇතුලත් නොවේ.